

# සටහන

2019 ඔක්තෝබර් - දෙසැම්බර් 38 වෙළුම 10 - 12 කලාපය


2 කිර්ගිස්තානයේ සමාජ, ආර්ථික තොරතුරු බිඳක්

3 ශ්‍රී ලංකාවේ ආර්ථිකය සවි කරන පහතරට තේ රස

21 දරිද්‍රතාව

26 විදේශ සංචිත සහ විනිමය අනුපාතික කළමනාකරණය

33 බදු වියදම් පිළිබඳ ව අප විමසිලිමත් ලෙස විශ්ලේෂණය කළ යුත්තේ මන්ද?


ISSN 1391-3697

01910

9 770041 001557

රු. 20/-

ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව






# කිර්ගිස්තානය

## සමාජ, ආර්ථික තොරතුරු බිඳක්...



"කිර්ගීස් ජනරජය" ලෙස නිල වශයෙන් හැඳින්වෙන කිර්ගිස්තානය සෑම දෙසින් ම ගොඩබිම්වලින් වට වූ මධ්‍යම ආසියාතික කඳුකර රාජ්‍යයක්. උතුරෙන් කසකස්තානයෙන් ද බටහිරින් සහ ගිනිකොන දෙසින් උස්බෙකිස්තානයෙන් ද නිරිතදෙසින් තජිකිස්තානයෙන් ද නිරිතදෙසින් චීනයෙන් ද සිමා වී ඇති කිර්ගිස්තානයේ අග නගරය වන බිෂ්කෙක් එරට විශාලතම නගරය ද වෙනවා.

වසර දෙදහසකට වඩා වැඩි ඉතිහාසයකට හිමිකම් කියන කිර්ගිස්තානය අධිරාජ්‍යයන් කිහිපයක ම පාලනයට නතු වූ විවිධ සංස්කෘතික උරුමයන්ට හිමිකම් කියන රාජ්‍යයක්. භූගෝලීය පිහිටීම නිසා හුදකලා වූ කඳුකර ප්‍රදේශයක් වූ නිසා ම පැරණි සංස්කෘතික වටිනාකම් බොහොමයක් සුරැකී තිබුණා. පුරාණ සේද මාවත ඇතුළු වෙළෙඳ මාර්ග කිහිපයක ම ආසන්නයේ පිහිටි මෙම භූමිය 1876 වසරේ සිට රුසියාවේ සාර්වරුන් යටතේ පාලනය වුනා. 1924 දක්වා ම ලිඛිත හෝඩියක්වත් නො තිබුණු මෙම රාජ්‍යය සාක්ෂරතාව අතින් සිටියේ ඉතාමත් පහළ තැනක. 1936 වසරේ සිට රුසියානු සමූහාණ්ඩුව යටතේ පාලනය වුණු කිර්ගිස්තානය 1991 දී සෝවියට් සමූහාණ්ඩුවේ අවසානයත් සමඟ ස්වාධීන රාජ්‍යයක් බවට පත් වුණා.

කැස්පියන් මුහුදට පමණක් විශාලත්වයෙන් දෙවැනි වන කරදිය විල වන "ඉසිකුල්" විල කිර්ගිස්තානයේ ලෝක ප්‍රකට මනස්කාන්ත කඳු පන්තියක් වන හිමෙන් වැසුණු "ටියෙන්ෂාන්" කඳු පන්තිය පාමුල පිහිටා තිබෙනවා.■

මූලාශ්‍ර - World Fact Book
Wikipedia විශ්වකෝෂය

| | |
|---|---|
| භූමි ප්‍රමාණය<br>මුළු ප්‍රමාණය වර්ග කි.මී.<br>ගොඩ බිම් ප්‍රමාණය වර්ග කි.මී.<br>අභ්‍යන්තර ජලාශ වර්ග කි.මී. | <br>199,951<br>191,801<br>8,150 |
| ජනගහනය (2019 ඇස්තමේන්තු) | 5,964,897 |
| ජනගහන වර්ධන වේගය | 0.96% |
| උපත් අනුපාතය (2019 ඇස්තමේන්තු)<br>(ජනගහනය දහසකට) | 20.6 |
| මරණ අනුපාතය (2019 ඇස්තමේන්තු)<br>(ජනගහනය දහසකට) | 6.3 |
| ළදරු මරණ අනුපාතය (2019 ඇස්තමේන්තු)<br>(සජීවී උපත් දහසකට) | 23.3 |
| උපතේ දී ජීවිත අපේක්ෂාව (අවුරුදු) (2019 ඇස්තමේන්තු) | 71.8 |
| දළ දේශීය නිෂ්පාදිතය (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 23.15 |
| මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය<br>(2017 ඇස්තමේන්තු) | 4.6% |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් 3,700 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය (2017 ඇස්තමේන්තු)<br>කෘෂිකර්මය<br>කර්මාන්ත<br>සේවා | <br>14.6%<br>31.2%<br>54.2% |
| ශ්‍රම බලකාය (2017 ඇස්තමේන්තු) | මිලියන 2.841 |
| සේවා වියුක්තිය (2017 ඇස්තමේන්තු) | 7.1% |
| කුටුම්භ ආදායමේ ගිනි සංගුණකය (2008 ඇස්තමේන්තු) | 27.30 |
| අයවැය අතිරික්තය (+) හෝ හිඟය (-) (2017 ඇස්තමේන්තු)<br>දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | -3.2% |
| උද්ධමන අනුපාතය (2017 ඇස්තමේන්තු) | 3.2% |
| ආනයන (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 4.187 |
| ආනයන භාණ්ඩ | තෙල් සහ ගෑස්, යන්ත්‍රසූත්‍ර, රසායන ද්‍රව්‍ය, ආහාර ද්‍රව්‍ය |
| අපනයන (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 1.84 |
| අපනයන භාණ්ඩ | රන්, කපු, ලෝම, ඇඟලුම්, මස්, රසදිය, පාවහන්, යුරේනියම් |
| මුදල් ඒකකය | කිර්ගිස්තානු සොම් |

"සටහන" සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

**2018 ජනවාරි මාසයේ සිට "සටහන" සඟරාව පළ වන්නේ තෙමසකට වරක් බව කරුණාවෙන් සලකන්න.**

සටහන

ශ්‍රී ලංකා මහ බැංකුව නමට ලියන ලද මුදල් ඇණවුම්/චෙක්පත් මෙහි සඳහන් ලිපිනයට එවීමෙන් "සටහන" තැපෑලෙන් ගෙන්වා ගත හැකි ය.

පිටපතක මිල : රු. 20.00
වාර්ෂික දායකත්වය : රු. 320.00
(තැපැල් ගාස්තු ද ඇතුළත්ව)

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590, කොළඹ



# ශ්‍රී ලංකාවේ ආර්ථිකය සවි කරන පහතරට තේ රස

**එම්. එස්. හඳුන්ගේ**
ප්‍රාදේශීය කළමනාකරු
ප්‍රාදේශීය කාර්යාලය - මාතර

## හැඳින්වීම

2016 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව වී සහ පොල්වලට පසු ශ්‍රී ලංකාවේ ප්‍රධානතම කෘෂිකාර්මික භෝගය වනුයේ තේ ය. එම වාර්තාවේ තව දුරටත් දැක්වෙන පරිදි දළ දේශීය නිෂ්පාදිතය සඳහා කෘෂිකාර්මික අංශයේ දායකත්වය 7.1%ක් වූ අතර ඉන් 9.2%කට ම දායක වන්නේ තේ වගාවයි. ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය සැලකිය යුතු විදේශීය විනිමය ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට අත් කර දෙයි. ශ්‍රී ලංකාව තේ නිෂ්පාදිතයෙන් 90% කට වඩා වැඩි ප්‍රමාණයක් අපනයනය කරයි. පසු කාලීන ව විදේශ විනිමය ගෙන එන මූලාශ්‍රවලින් විදේශීය රැකියා, ඇඟළුම් සහ සංචාරක කර්මාන්තය ඉහළට පැමිණිය ද 1980 තරම් මෑතක් වන තුරු ම ශ්‍රී ලංකාවට විදේශ විනිමය ගෙන ඒමේ මූලිකත්වය දැරුවේ තේ වගාවයි. චීනය සහ ඉන්දියාව ලෝකයේ තේ නිෂ්පාදනය කරන රටවල් අතර ඉහළින් සිටිය ද ඔවුන් ඉහළ ම තේ පරිභෝජනය කරනු ලබන රටවල් ද වේ. එම නිසා ඔවුන්ගේ තේ නිෂ්පාදනය ඉහළ අගයක් ගන්නා අතර ම තේ පරිභෝජනය ද ඉහළ අගයක් ගනී. නමුත් ශ්‍රී ලංකාව, කොරියාව වැනි රටවල තේ නිෂ්පාදනයට සාපේක්ෂ ව තේ පරිභෝජනය එ තරම් ඉහළ අගයක් නො ගනී.



## ඉතිහාසය

### ශ්‍රී ලංකාව තුළ ප්‍රථම තේ ශාකය රෝපණය

පරම්පරා ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාවේ තේ ලොව පුරා ප්‍රචලිතව පවතින්නේ සිලෝන් ටී (Ceylon Tea) යන නමිනි. සිලෝන් ටී හා සම්බන්ධ කථාව වසර 200ක් තරම් ඈතකට, එ නම් බ්‍රිතාන්‍ය යටත් විජිත යුගය දක්වා දිව යයි. 1824 දී පළමු වතාවට බ්‍රිතාන්‍ය ජාතිකයකු විසින් චීනයෙන් තේ පැළයක් ලංකාවට ගෙන ආ අතර, එය පේරාදෙණිය රාජකීය උද්භිද



උද්‍යානයේ වාණිජ නො වන අවශ්‍යතාව වෙනුවෙන් රෝපණය කරන ලදි. පෙරදිග ඉන්දියානු සමාගම නැමති ආයතනය විසින් ඇසෑම් සහ කල්කටා යන ප්‍රදේශවලින් ගෙන්වන ලද කුරුඳු භෝගය පර්යේෂණ ශාඛයක් ලෙස වගා කිරීම 1839 දී ආරම්භ කරන ලදි.

### වාණිජ වගාවක් ලෙස තේ ව්‍යාප්තිය

කෙසේ වුව ද 1839න් පසු දශක දෙකක් ගත වන තුරුත් තේ වගාවේ එතරම් ප්‍රගතියක් දැක ගත හැකි නො වී ය. තේ වගාව වාණිජ වගාවක් ලෙස කිරීම ආරම්භ කරන ලද්දේ ස්කොට්ලන්ත ජාතිකයෙකු වන ජේම්ස් ටේලර් (James Taylor) විසිනි. ජේම්ස් ටේලර් 1852 දී ශ්‍රී ලංකාවට පැමිණ මහනුවර ලූල්කඳුර වතුයායේ (Loolecondera Estate) පදිංචි වී ඇත. 1866 වර්ෂයේ දී ඉන්දියාවට ගොස් තේ වගාව සම්බන්ධයෙන් වන මූලික තත්ත්වයන් පිළිබඳ ව කරන ලද අධ්‍යයනයේ ප්‍රතිඵලයක් ලෙස 1867 දී ටේලර් විසින් ලූල්කඳුර වතුයායේ අක්කර 19ක තරමේ තේ වගාවක් ආරම්භ කරන ලදි.

මෙය ශ්‍රී ලංකාව තුළ වාණිජ වගාවක් වශයෙන් තේ වගාවේ ආරම්භය ලෙස සැලකේ. ඒ වන විටත් ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්ත වෙමින් පැවති දිලීර රෝගයක් හේතුවෙන් එතෙක් කලක් කෝපි වගාව කළ වගාකරුවෝ ක්‍රමයෙන් තේ වගාව සඳහා යොමු වෙමින් සිටියහ. ඒ අනුව, මහනුවර ලූල්කඳුර වතුයාය වටා පිහිටා තිබූ හෝප් (Hope), රොක්වුඩ් (Rockwood) සහ මුල්ඔය (Mooloya) වැනි වතුයායන්හි තේ වගාව ඇරඹුණි. මෙම වතු ශ්‍රී ලංකාවේ පළමුවෙන් ම ස්ථාපනය කරන ලද තේ වතු අතර ඉහළින් ම පවතී.




### ශ්‍රී ලංකාවේ ප්‍රථම තේ කර්මාන්ත ශාලාව

ටේලර් විසින් සිදු කරන ලද පර්යේෂණවල ප්‍රතිඵලයක් ලෙස 1872 දී මහනුවර ලූල්කඳුර වතුයායේ ඔහුගේ බංගලාවේ ආලින්දයේ ශ්‍රී ලංකාවේ ප්‍රථම තේ කර්මාන්ත ශාලාව ලෙස සැලකිය හැකි කර්මාන්ත ශාලාව ආරම්භ කරන ලදි. මෙහි දී මේස මත අතින් තේ කොළ පෙරළීම සිදු වූ අතර තේ කොළ මෙළවීම (firing) ගිණි අඟුරු සහිත මැටි බඳුන් ආශ්‍රයෙන් සිදු විය. තේ කොළ වියළීම සඳහා කම්බියෙන් වේලන ලද තැටි භාවිත කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ඉතා ප්‍රණීත තේ කෝප්පයක් බිහිවීම, එ නම් පළමු වාණිජ තේ කෝප්පය පෙරීම සිදු විය. ටේලර් විසින් පසු ව තේ කොළ පෙරළීම සඳහා සරල යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය කරන ලද අතර එවකට ශ්‍රම දායකත්වයේ ද කිසිදු අඩුවක් නො පැවතුණි. 1875 දී ටේලර් විසින් පළමු "සිලෝන් ටී" තොගය ලන්ඩන් තේ වෙන්දේසිය වෙත නැව්ගත කරන ලදි. එය ටොන් 23ක පමණ බරකින් යුක්ත විය. ටේලර් සිය නවෝත්පාදන සිතුවිලි පදනම් කර ගනිමින් තේ කර්මාන්තයේ සංවර්ධනයට දායක වූ අතර 1892 වර්ෂයේ දී ජීවිතක්ෂයට පත් විය.

### ටේලර්ගෙන් පසු යුගය

තේ වගාව ක්‍රමයෙන් වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර කෝපි වගාව කළ බොහොමයක් වතු පසුකාලීන ව තේ වගාව සඳහා යොදා ගැනිණ. 1899 වර්ෂය වන විට තේ වගාව අක්කර 400,000ක් තරම් විශාල භූමි ප්‍රදේශයක් පුරා ව්‍යාප්ත ව පැවතුණි. පසුකාලීන ව ශ්‍රී ලංකාවට පැමිණි රැනොල්ෆ් ට්‍රැෆර්ඩ් (Ranolph Trafford) වැනි බ්‍රිතාන්‍ය ජාතිකයෝ තේ වගාව සම්බන්ධයෙන් ඉහළ දැනුමකින් හෙබි අය වූ අතර ඔවුහු ප්‍රධාන තේ වතුයායන් සමඟ සමීප සම්බන්ධතාවක් දක්වූ හ. 1877 දී සැමුවෙල් සී ඩේවිඩ්සන් (Samuel C Davidson) විසින් "සිරොක්කෝ" (Sirocco) නැමති තේ වියළනය ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලදි. 1880 දී ජෝන් වෝකර් සහ සමාගම (John Walker & Company) තේ පෙරළන යන්ත්‍රයක් හඳුන්වා දෙන ලදි. මෙ වැනි යන්ත්‍ර හඳුන්වා දීමත් සමඟ නුවරඑළියේ ෆෙයරි ලෑන්ඩ් වතුයාය (Fairy Land Estate) වැනි වතු තුළ එංගලන්තයෙන් ගෙන්වන ලද යාන්ත්‍රික උපකරණ සවි කරන ලදි.

### "සිලෝන් ටී" වෙන්දේසිය

වැඩි කලක් ගත නො වී "සිලෝන් ටී" නාමය ලෝකය පුරා ජනප්‍රිය වන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස තේ

අළෙවිය සඳහා මැදිහත්වීමේ සහ සොයා බැලීමේ අවශ්‍යතාවක් මතු විය. ඒ අනුව, තේ වෙන්දේසිවල තේ අළෙවිය ආරම්භ විය. ශ්‍රී ලංකාවේ ප්‍රථම තේ වෙන්දේසිය ලංකා වාණිජ මණ්ඩලයේ අනුග්‍රහයෙන් 1883 ජූලි මාසයේ දී සොමර්විල් සහ සමාගම (Somer Ville & Company) පරිශ්‍රයේ දී සිදු විය. 1893 දී චිකාගෝ ලෝක වෙළෙඳ සල්පිලේ දී තේ පැකට් මිලියනයක් ලන්ඩන් තේ වෙන්දේසියේ දී අලෙවි වූ අතර කිලෝග්‍රෑම් 1කට පවුම් 36.15ක් වූ වාර්තාගත මිලකට අළෙවි විය.

### තේ වෙළෙඳාම තවදුරටත් ශක්තිමත් වීම

1894 වර්ෂයේ දී ලංකා තේ වෙළෙඳුන්ගේ සංගමය (Ceylon Tea Traders' Association) ආරම්භ වූ අතර වර්තමානයේ ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන තේ අළෙවිය සිදු වන්නේ මෙම සංගමය සහ වාණිජ මණ්ඩලය (Chamber of Commerce) හරහා ය. තේ කර්මාන්තයට නව ශක්තියක් වෙමින් 1896 දී කොළඹ තැරැව්කරුවන්ගේ සංගමය (Colombo Brokers' Association) ද 1925 දී තේ පර්යේෂණ ආයතනය ද පිහිටු විය. 1927 වන විට ලංකාවේ තේ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 100,000 ඉක්මවූ අතර එය සම්පූර්ණයෙන් ම පාහේ අපනයනය කරන ලදි.

1932 වර්ෂයේ දී තේ ප්‍රචාරක මණ්ඩලය (Tea Propaganda Board) පිහිටු විය. 1941 වර්ෂය තුළ දී ප්‍රථම ශ්‍රී ලාංකික තේ තැරැව්කාර ආයතනය වන සීමාසහිත පීරිස් සහ අබේවර්ධන සමාගම සිය ව්‍යාපාරික කටයුතු ආරම්භ කළේ ය. 1958 දී රාජ්‍ය වැවිලි සංස්ථාව (State Plantations Corporation) ස්ථාපිත කෙරුණි. ඒ අනුව අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කළ ශ්‍රී ලාංකික තේ නිෂ්පාදනය 1960 වර්ෂය වන විට හෙක්ටයාර 200,000ක් පුරා විහිදුනු වගාවකින් යුත් මෙට්‍රික් ටොන් 200,000ක් ඉක්මවා නිෂ්පාදිතයක් සිදු කරන තත්ත්වයක් දක්වා වර්ධනය විය.

### තේ අපනයනකරුවන් අතර ප්‍රමුඛයා වීම

1963 දී ශ්‍රී ලංකාව තුළ ක්ෂණික තේ නිෂ්පාදනය සහ අපනයනය ආරම්භ විය. 1965 දී ලොව තේ අපනයනකරුවන් අතර ප්‍රමුඛයා බවට පත් වීමට ශ්‍රී ලංකාව සමත් විය. ඒ අනුව වර්ෂ 100ක සාර්ථක ගමන් මගක් සනිටුහන් කරමින් 1966 දී පළමු අන්තර්ජාතික තේ සම්මේලනය ශ්‍රී ලංකාවේ දී පැවැත්වුණි. 1970 වර්ෂයේ දී එවකට ශ්‍රී ලංකාවේ පැවති රජය බ්‍රිතාන්‍ය සමාගම් සතු ව පැවති තේ වතු ජනසතු කරන ලදි. ඒ අනුව රජය විසින් අත්පත් කර ගත් වතු පාලනය කිරීම සඳහා ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වැනි ආයතන මෙන් ම 1976 දී ශ්‍රී ලංකා තේ මණ්ඩලය ද පිහිටුවන ලදි. එ සේ ම 1976 දී ශ්‍රී ලංකාවේ තේ අපනයනයට නව මංපෙත් විවර කර ගනිමින් කුඩා තේ මලු අපනයනය ද ආරම්භ විය.

මෙසේ ක්‍රමයෙන් ශ්‍රී ලංකාවේ තේ රස ලොව පුරා පිළිගැනීමට ලක් විය. 1980 මොස්කව් ගිම්හාන ඔලිම්පික් ක්‍රීඩා උත්සවය සඳහා නිල තේ සැපයුම්කරු වශයෙන් ශ්‍රී ලංකාව පිළිගැනීමට ලක් වූවා. එමෙන් ම 1982 දී බ්‍රිස්බේන්හි පැවති දොළොස්වන පොදු රාජ්‍ය මණ්ඩල ක්‍රීඩා උළෙල සහ 1987 දී ඕස්ට්‍රේලියාවේ පැවති එක්ස්පෝ 88 ප්‍රදර්ශනය සඳහා ද නිල තේ සැපයුම්කරු වූයේ ශ්‍රී ලංකාවයි.

තේ සංයෝග කිරීම, ආනයනය කිරීම සහ තේ ප්‍රතිඅපනයනය කිරීම සඳහා 1981 වර්ෂයේ දී අනුමැතිය ලැබිණි. ලොව පුරා ප්‍රචලිත ව ඇති හරිත තේ (Green Tea) නිෂ්පාදනය සහ අපනයනය ශ්‍රී ලංකාවේ අරඹන ලද්දේ 1982 වසරේ දී ය. ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනයේ 125 වන සංවත්සරය කොළඹ දී අති උත්කර්ෂවත් අයුරින් පැවැත්විණ. 1992-1993 කාලය තුළ එතෙක් කලක් රජය සතු ව පැවති තේ වතු බොහොමයක් පෞද්ගලීකරණය කරන ලදි. ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වැනි රාජ්‍ය ආයතනවල පැවති අධික දේශපාලන බලපෑම්, අධික ශ්‍රමිකයන් ප්‍රමාණය සහ දුර්වල කළමනාකරණය සමඟ ඇති වූ අඩු ඵලදායීත්වය, අධික අලාභ තත්ත්වයන් මෙම ආයතන අධික අවදානමකට ලක් විය. ඒ අනුව 1990 දී රජයේ තේ වතු පෞද්ගලීකරණය



කර ප්‍රාදේශීය වතු සමාගම් (Regional Plantation Companies - RPCs) 23ක් ඇති කරන ලදි.

1996 වන විට ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 250,000ක් ඉක්ම වූ අතර වර්ෂ 2000 වන විට එය මෙට්‍රික් ටොන් 300,000 ඉක්මවන ලදි. පෞද්ගලීකරණය යටතේ මෑත කාලීන ව යම් වර්ධනයක් දැක ගත හැකි වුව ද වර්තමාන තේ වගාකරුවෝ අඩු ඵලදායීත්වය, අධික නිෂ්පාදන පිරිවැය, ප්‍රමාණවත් ලෙස පොහොර භාවිත නො කිරීම සහ අඩු ලාභදායීත්වය මත අභියෝග රැසකට මුහුණ දෙති. පෞද්ගලීකරණය හරහා ප්‍රාදේශීය වතු සමාගම් ඇති වීම හේතු කොට ගෙන කුඩා තේ වතු සඳහා වැඩි ඉඩකඩක් ලැබිණි. ඒ අනුව වර්තමානයේ ප්‍රාදේශීය වතු සමාගම්වල වැදගත්කම අඩු වී යමින් කුඩා තේ වතු වැඩි අවධානයක් ලබා ගැනීමට සමත් ව ඇත. ඒ අනුව රටේ තේ නිෂ්පාදනයෙන් 3/4කට වැඩි ප්‍රමාණයක් සඳහා කුඩා තේ වතුහිමියන් දායකත්වය ලැබෙන අතර ඉන් වැඩි ප්‍රමාණයක් අක්කරයකට වඩා අඩු ඉඩම් වේ. 2017/2016 වර්ෂවල අවසාන කාර්තුවේ තේ නිෂ්පාදනය පිළිබඳ විස්තර 1 වන වගුවේ දැක්වේ.

2016/2017 දිස්ත්‍රික්ක පාදක කර ගත් තේ නිෂ්පාදනය පිළිබඳ විස්තර 2 වන වගුවේ දැක්වේ.

2016ට සාපේක්ෂ ව 2017 වර්ෂයේ දී පහතරට තේ වගාව සිදු කරන ප්‍රධාන දිස්ත්‍රික්ක වන ගාල්ල, මාතර පිළිවෙළින් 6.88%ක සහ 13.51%ක ප්‍රගතියක් අත්කර ගෙන ඇත. 2016 වර්ෂයට සාපේක්ෂ ව 2017 වර්ෂයේ දී තේ මිල ගණන් සඳහා ඉහළ වටිනාකම් ලැබුණි. ඒ අනුව පහතරට තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල 149.56කින් වර්ධනය වූ අතර එය 31.92%ක වර්ධනයක් විය. ඒ අනුව උප දිස්ත්‍රික්ක වෙන්දේසි මිල ගණන් 3 වන වගුවෙන් දැක්වේ.

2017 වර්ෂයේ දී තේ සඳහා වන ඉහළ ම මිල මාතර ප්‍රදේශයෙන් වාර්තා වූ අතර එය කි. ග්‍රෑ. 1ක් සඳහා රු. 650.00ක් තරම් ඉහළ අගයක් විය. ඉන් පසු පිළිවෙළින් ගාල්ල, කළුතර සහ දෙනියාය යන ප්‍රදේශවල තේ සඳහා ඉහළ මිලක් ලැබුණි.

නව තාක්ෂණයේ පෙරළියත් සමඟ 2001 වර්ෂයේ දී කොළඹ තේ වෙන්දේසියේ දී පළමු අන්තර්ජාල තේ අලෙවිය ෆෝබ්ස් සහ වෝකර් සමාගම විසින් සිදු කරන ලදි. 2002 වසරේ දී තේ සඳහා වෙන් වූ

**1 වන වගුව - 2017/2016 වර්ෂවල අවසාන කාර්තුවේ තේ නිෂ්පාදනය**

| වර්ගය | ඔක්. - දෙසැ. (කි. ග්‍රෑ. මෙට්‍රික් ටොන්) | | වෙනස | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | ප්‍රමාණය (කි. ග්‍රෑ. මෙට්‍රික් ටොන් ) | % |
| **භූමියේ උස අනුව වර්ගීකරණය** | | | | |
| ඉහළ | 14.47 | 15.31 | -0.85 | -5.53 |
| මධ්‍යම | 10.55 | 10.47 | 0.08 | 0.78 |
| පහළ | 48.73 | 47.19 | 1.55 | 3.28 |
| **එකතුව** | **73.75** | **72.97** | **0.78** | **1.07** |
| **සැකසුම් ක්‍රමය අනුව වර්ගීකරණය** | | | | |
| Orthodox | 67.66 | 68 | -0.34 | -0.49 |
| CTC | 5.59 | 4.43 | 1.17 | 26.37 |
| හරිත තේ | 0.49 | 0.54 | -0.05 | -9.28 |
| **එකතුව** | **73.75** | **72.96** | **0.78** | **1.07** |

මූලාශ්‍රයː Tea Market Update Volume 13, No 04 - ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**2 වන වගුව - පරිපාලන දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදනය**

| පරිපාලන දිස්ත්‍රික්කය | 2017 | 2016 | වර්ධනය | වර්ධනය % |
|---|---|---|---|---|
| රත්නපුරය | 70.99 | 68.00 | 2.99 | 4.40 |
| නුවර එළිය | 58.26 | 60.23 | -1.97 | 3.26 |
| ගාල්ල | 45.72 | 42.77 | 2.94 | 6.88 |
| මාතර | 38.75 | 34.13 | 4.61 | 13.51 |
| මහනුවර | 33.44 | 33.71 | -0.27 | -0.80 |
| බදුල්ල | 28.07 | 24.46 | 3.62 | 14.79 |
| කළුතර | 20.41 | 18.49 | 1.92 | 10.38 |
| කෑගල්ල | 9.10 | 8.32 | 0.79 | 9.47 |
| මාතලේ | 1.38 | 1.44 | -0.06 | -4.18 |
| කොළඹ | 0.78 | 0.6 | 0.18 | 30.05 |
| කෑගල්ල | 0.19 | 0.22 | -0.03 | 15.47 |
| එකතුව | 307.08 | 292.36 | 14.72 | 5.03 |

මූලාශ්‍රය: Tea market update Volume 13, No 04 - ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**3 වන වගුව - උප දිස්ත්‍රික්කයන්හි තේ වෙන්දේසි මිල ගණන්**

| උප දිස්ත්‍රික්කය | 2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා | | | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | කි.ග්‍රෑ. 01 ක මිල වෙනස්වීම | වෙනස්වීම % |
| නුවර එළිය | 598.57 | 432.17 | 166.4 | 38.5 |
| බස්නාහිර (ප්‍රදේශ 08ක්) | 613.18 | 462.52 | 150.66 | 32.57 |
| මධ්‍යම (ප්‍රදේශ 09ක්) | 556.92 | 416.76 | 140.17 | 33.63 |
| උඩ පුස්සැල්ලාව (ප්‍රදේශ 02ක්) | 560.3 | 394.79 | 165.51 | 41.92 |
| ඌව (ප්‍රදේශ 08ක්) | 574.77 | 431.31 | 143.46 | 33.26 |
| පහතරට (ප්‍රදේශ 10ක්) | 642.32 | 490.61 | 151.7 | 30.92 |
| සාමාන්‍ය මිල | 618.18 | 468.62 | 159.56 | 31.92 |

මූලාශ්‍රය: Tea market update Volume 13, No 04 - ශ්‍රී ලංකා තේ මණ්ඩලය

කෞතුකාගාරයක් මහනුවර දී ආරම්භ කරන ලදි. 2013 වසර අග වන විට ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 340,000 ඉක්මවන ලදි.

1867 දී අක්කර 19කින් නුවර දී ආරම්භ වූ වාණිජ තේ නිෂ්පාදනය අද වන විට ප්‍රධාන ප්‍රදේශ 6ක් පුරා ව්‍යාප්ත ව පවතී. එහි ප්‍රධාන ප්‍රදේශයන් වනුයේ නුවරඑළිය, දිඹුල, නුවර, උඩ පුස්සැල්ලාව, ඌව පළාත සහ දකුණු පළාත වශයෙනි.

## ලෝක තේ පරිභෝජනය සහ වෙළෙඳාම

### ලෝක තේ පරිභෝජනය

ජලය හැරුණු විට ලෝකයේ ඊ ළඟ ජනප්‍රියතම පානය තේ ය. වර්තමානය වන විට ලොව පුරා රටවල් 50ක පමණ තේ වවනු ලබන අතර රටවල් 160කට වඩා වැඩි ප්‍රමාණයක ජනතාව පුරුද්දක් වශයෙන් තේ පානය කරයි. සාමාන්‍යයෙන් ලොව පුරා බිලියන 3ක පමණ

ප්‍රමාණයක් තේ පරිභෝජනය කරන බව දැක්වේ. රසය අනුව සලකා බලන කළ තේ පරිභෝජනය රටකින් රටකට වෙනස් වේ. කොරියාව වැනි රටක පාරිභෝගිකයන් වැඩි දෙනා ඈත අතීතයේ සිට හරිත තේ සඳහා වැඩි නැඹුරුවක් දක්වයි. තායිලන්තය, ඇමරිකාව වැනි රටවල තේ පාරිභෝගිකයන් ඉතා මෑතක දී හරිත තේ සඳහා නැඹුරුවක් දැක්වුව ද ඔවුන්ගේ කැමැත්ත දුඹුරු පාට සහිත, පලතුරු රස සහිත, පැණි රසැති එතරම් තද කොළ පාටක් නොමැති තේ සඳහා වේ.

## ප්‍රමිතිවල වෙනස්කම්

ලොව සියලු ම රටවල තේ පාරිභෝගිකයන්ට ඇත්තේ එක ම ආකාරයේ තේ රුචියක් නො වේ. උදාහරණයක් ලෙස රුසියාව සහ සමහර පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල්වල ජනප්‍රිය ම තේ පානය සිලෝන් ටී වුව ද, පකිස්ථානය සහ ඊජිප්තුව තුළ වඩාත් ම ජනප්‍රිය තේ පානය වනුයේ Cut-Tear-Curl (CTC) තේ ය. උතුරු ඇමරිකාවේ වඩාත් ජනප්‍රිය තේ පානය වනුයේ Light Liquoring තේ ය.

## ලෝක තේ නිෂ්පාදිතයන්හි සහ ක්‍රියාවලියේ වැඩි දියුණු වීම්

අප බොහෝ දෙනා දන්නා පරිදි බොහෝ රටවල්වල කාලයක් පුරා භාවිත කරන ලද්දේ සම්ප්‍රදායික තේ (Loose Tea) වේ. නමුත් එම ක්‍රමයේ ඇති අපහසුතාවන් හේතුවෙන් අද වන විට විවිධ හැඩැති කුඩා තේ මලු සහිත අසුරණයන් දැක ගත හැකි ය. මෙ වැනි ඇසුරුම් නිසාවෙන් තේ නිෂ්පාදිත සඳහා අගය එකතු වීමක් සිදු වී ඇත. තේ පිළිබඳ ව විවිධ රටවල්වල කැමැත්ත 4 වන වගුවේ දැක්වේ.

තවමත් තේ පාරිභෝජනයේ ප්‍රමුඛ නිෂ්පාදන ලෙස සැලකෙන්නේ හරිත තේ (Green Tea) සහ කළු තේ (Black Tea) ය. කෙසේ වූ ව ද ශීත කළ තේ, පලතුරු රසැති තේ, පෙණ සහිත තේ, ඖෂධීය තේ, බීමට සූදානම් තේ, ක්ෂණික තේ සහ කාබනික ව නිෂ්පාදනය කරන ලද තේ යනාදිය ඉතා නුදුරේ දී ම වෙළෙඳපොළ ආක්‍රමණය කරනු ඇත. එ සේ ම තේ ආශ්‍රිත ව නිෂ්පාදනය කරන ලද විවිධ ආහාර ද වෙළෙඳපොළට එමින් පවතී. උදාහරණයක් ලෙස තේ බත්, තේ නූඩ්ල්ස්, තේ කේක්, තේ බිස්කට්, තේ වයින්, තේ සූකිරි සහ තේ අයිස්ක්‍රීම් යනාදිය වේ.

## ඇමරිකානු තේ වෙළෙඳපොළ


ඇමරිකා එක්සත් ජනපදය තුළ තේ සඳහා ඉතා ම හිතකර වෙළෙඳපොළක් ඇත. ඇමෙරිකානු කුටුම්භයන්ගෙන් 80%ක් පමණ තේ පරිභෝජනයට හුරු වී ඇත. ඇමරිකා එක්සත් ජනපද තේ සංගමය (Tea Association of the USA) සඳහන් කරන පරිදි ඇමරිකානු තේ වෙළෙඳාමේ වර්ධනයක් 2017 දී ද සුපුරුදු පරිදි දැක ගත හැකි විය. Millenialas, Gen - X, Gen - Y, Baby Boomers වැනි සියලු ම ජන විකාසයන් අනාගත තේ ඉල්ලුම තවදුරටත් වැඩි කරනු ඇත. එ සේ ම දැනටමත් තේ සඳහා ඉතා ම ඉහළ ඉල්ලුමක් ඇති Gen - Z ඉදිරියටත් එලෙස ම තේ ඉල්ලුම පවත්වා ගෙන යනු ඇත. ඇමෙරිකානු තේ සංගමය පවසන පරිදි දිනකට සාමාන්‍යයෙන් ඇමරිකානුවෝ මිලියන 158කට වඩා වැඩි ප්‍රමාණයක් තේ පරිභෝජනය කරති. 2017 දී ඇමරිකාව විසින් ආනයනය කරනු ලැබූ තේ ප්‍රමාණය ඊට කලින් වසරට සාපේක්ෂ ව 1%ක වර්ධනයකි. 2017 දී කළු තේ සඳහා ඉල්ලුම 2.3%ක වර්ධනයක් පෙන්නුම් කරද්දී හරිත තේ සඳහා වන ඉල්ලුම අඩු වීම සුවිශේෂ ලක්ෂණයකි. එ සේ ම කාඩ්බෝඩ්, කඩදාසි මෙන් ම බලශක්තිය සහ ශ්‍රම පිරිවැය ඉහළ යෑම හේතුවෙන් තේ මිල ඉදිරියේ දී ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

3% - 4%ක් අතර වර්ධනය වූ "බීමට සූදානම් තේ" සඳහා වන 2017 වෙළෙඳපොළ කොටස 45.7%ක් තරම් ඉහළ

**4 වන වගුව - රට රටවල තේ රුචිය**

| තේ වර්ගය | රටවල් |
|---|---|
| ශීත කළ තේ | ඇමරිකා එක්සත් ජනපදය |
| පලතුරු රසැති තේ | යුරෝපය |
| පෙණ සහිත තේ | තායිවානය |
| ඖෂධීය තේ | ඇමරිකා එක්සත් ජනපදය, චීනය, ජපානය, තායිලන්තය |
| බීමට සූදානම් තේ | ජපානය, ඇමරිකා එක්සත් ජනපදය, තායිවානය |

**1 වන රූප සටහන - එක්සත් ජනපද තේ වෙළෙඳපොළ (මුළු තොග වටිනාකම 1990-2015)**





මූලාශ්‍රය: Tea Association of the USA; Statistica 2017

අගයක් විය. සාමාන්‍යයෙන් වෙළෙඳපොළ තුළ ඇති "කුඩා තේ මලු" මිලට වඩා "බීමට සුදුසු තේ" මිල ගණන් අධික අගයක් ගත්ත ද එහි ඇති නම්‍යශීලිත්වය, පහසුව සහ සීනි සහිත බීමවලට විකල්පයක් ලෙස භාවිත වීම යන සාධක හේතුවෙන් පාරිභෝගිකයන් අතර වැඩි ජනප්‍රියතාවක් පෙන්නුම් කරයි.

### එක්සත් රාජධානියේ තේ වෙළෙඳපොළ

එක්සත් රාජධානිය තුළ තේ සඳහා ඉහළ වටිනාකමක් පවතී. බටහිර යුරෝපයේ ඉහළ ම තේ පාරිභෝගිකයා වනුයේ ද එක්සත් රාජධානිය වේ. ප්‍රතිශතයක් වශයෙන් එය 63%ක් තරම් වේ. එක්සත් රාජධානියේ තේ වෙළෙඳපොළ තුළ 60%ක තරම් ප්‍රමාණයක ඉල්ලුම ඇත්තේ කළු තේ සඳහා වන අතර පලතුරු සහ ඖෂධීය තෙ මෙන් ම හරිත තේ සඳහා ද ඉල්ලුමක් පවතී. කෙසේ වුව ද පසුගිය වසර කිහිපය දිහා ආපසු හැරී බැලීමේ දී එක්සත් රාජධානි තේ වෙළෙඳපොළ පසුගාමී වූ තත්ත්වයක් දැක ගත හැකි ය. 2010 - 2015 කාලය සලකා බැලීමේ දී එක්සත් රාජධානි තේ පරිභෝජනය 2010 ටොන් 97 සිට 2015 ටොන් 76ක් දක්වා 21%කින් පමණ පහත බැස ඇත.


**2 වන රූප සටහන - 2015 දී එක්සත් රාජධානියේ තේ වෙළෙඳපොළ (කොටස් වටිනාකම මත පදනම් ව)**




ඖෂධීය තේ


මූලාශ්‍රය : Statista 2017

### 3 වන රූප සටහන - එක්සත් රාජධානියේ තේ පරිභෝජනය





මූලාශ්‍රය: Mintel

### 4 වන රූප සටහන - එක්සත් රාජධානිය තුළ තේ පරිභෝජන නැඹියාව




මූලාශ්‍රය: Mintel

### 5 වන රූප සටහන - 2016 වර්ෂයේ දී එක්සත් රාජධානියේ තේ පරිභෝජන රටා




මූලාශ්‍රය: Survey on "How do you take your tea?" - Statista 2017

මින්ටෙල් (Mintel) පර්යේෂණ වාර්තා අනුව පාරිභෝගිකයන් වඩාත් උද්දීපනයකින් යුත් උණුසුම් බීම වර්ග සඳහා වැඩි කැමැත්තක් දක්වන නැඹුරුතාවක් දැක ගත හැකිය.

කාලයක් පුරා යුරෝපීය තේ වෙළෙඳපොළ ග්‍රහණය කර ගෙන සිටි කුඩා තේ මලු සඳහා වන ඉල්ලුම ක්‍රමයෙන් අඩු වී යෑමක් දැක ගත හැකි ය. ඒ වෙනුවට පලතුරු/ඖෂධීය තේ, හරිත තේ සඳහා ඉල්ලුම වැඩි වීමක් දැක ගත හැකි ය.

2016 දී Statista සිදු කළ පර්යේෂණයට අනුව 34%ක් කිරි සමග සීනි රහිත ව තේ පානය කිරීමට කැමැත්තක් දක්වන බව සොයා ගන්නා ලදි.

## ශ්‍රී ලංකාවේ පරිභෝජනය සහ වෙළෙඳාම

### ශ්‍රී ලංකාවේ විවිධ තේ රස

තේ ගස හැදෙන ප්‍රදේශය අනුව තේ රසය විවිධ වේ. ශ්‍රී ලංකා තේවල සුවිශේෂිත්වය වනුයේ මෙම සාධකයයි. ඒ අනුව ශ්‍රී ලංකාව තුළ දැකිය හැකි විවිධ තේ රස පහත පරිදි වර්ගීකරණයකට ලක් කළ හැකි ය.

**කළු තේ** (Black Tea)፡ බොහෝ තේ පාරිභෝගිකයන් අතර කළු තේ ඉතා ජනප්‍රිය පානයකි. තේ දළු නෙළන්නන්නියන්ගේ සුරතින් නෙළන තේ දළු භාවිතයෙන් කළු තේ නිෂ්පාදනය කෙරේ. පෙරා ගනු ලැබූ තේ කොළ විවිධ ශ්‍රේණිගත කිරීම්වලට ලක් කරනු ලැබේ. සෑම වර්ගයකට ම වෙනස් පැහැයක් සහ තීව්‍රතාවක් දැක ගත හැකි ය. ඒ අනුව, විශිෂ්ට ආකාරයෙන් මිශ්‍රණය කරන ලද විවිධ කළු තේ වර්ග දැක ගත හැකි ය. ශ්‍රී ලංකාව තුළ දැක ගත හැකි කළු තේ වර්ග වනුයේ English Breakfast, English Afternoon, Irish Breakfast, Earl gray, Lap sang souchong, Spiced Masala, Rose and French Vanilla) Black Tea with Berries ආදියයි.

**හරිත තේ** : ලංකා හරිත තේ සඳහා ඉහළ ආකර්ෂණයක් දැක ගත හැකි ය. ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරන හරිත තේවලට උදාහරණ ලෙස Real leaf green tea, Jasmine green tea, Mint green tea & Lemongrass green tea දැක්විය හැකි ය.

**සුදු තේ** (White Tea)፡ සුදු තේ ශ්‍රී ලංකාවට ආවේණික තේ වර්ගයකි. මිල අතින් ඉතා ඉහළ වටිනාකමක් ගනී. සුදු ටී නිෂ්පාදනය සඳහා භාවිතා කරන්නේ සියුමැලි ව පරිස්සමෙන් නෙළා ගත් තේ දළු ය. සුදු තේ නිෂ්පාදනය සම්පූර්ණයෙන් ම අතින් කෙරෙන ක්‍රියාවලියකි. මෙම සුදු තේ "සිල්වර් ටී" යන නමින් ද හැඳින්වේ. ශ්‍රී ලංකාව තුළ දැක ගත හැකි සුදු තේවලට උදාහරණ ලෙස Real white tea, Ceylon silver tips, White litchee hand rolled tea, Jade butterfly handmade white tea යනාදිය දැක්විය හැකි ය.

තව ද විවිධ වශයෙන් රස ගන්වන ලද තේ වර්තමානයේ අපනයන වෙළෙඳපොළට එකතු වෙමින් පවතී. රාස්බෙරි රස ගන්වන ලද තේ, ලෙමන් රසය සහිත තේ, ඉඟුරු රසය සහිත තේ, ස්ට්‍රෝබෙරි රසය සහිත තේ, මින්ට් රසය සහිත තේ, වැනිලා රසය සහිත තේ, සහ කුරුඳු රසය සහිත තේ, යනාදී වශයෙනි.

### ශ්‍රී ලංකාවේ වර්තමාන තේ වෙළෙඳපොළ

ශ්‍රී ලංකා තේ අපනයනකරුවන්ගේ සංගමය වාර්තා කරන පරිදි 2016 තේ නිෂ්පාදනය කි.ග්‍රෑ. මිලියන 292.50ක් වූ අතර 2017 වන විට ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය කි.ග්‍රෑ. මිලියන 307.08ක් දක්වා 4.9%කින් වර්ධනය විය. තේ සඳහා වන වර්ගීකරණයන් සලකා බැලීමේ දී Orthodox Tea 4%ක් තරම් සාමාන්‍ය වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර 2016 වසරට සාපේක්ෂ ව CTC සහ හරිත තේ පිළිවෙලින් 16.6%ක් සහ 13.0%ක, වර්ධනයක් පෙන්නුම් කරන ලදි.

කෙසේ වුව ද තේ අපනයනය සලකා බැලීමේ දී 2016ට සාපේක්ෂ ව 2017 වසරේ දී එතරම් වෙනසක් දැක ගත නො හැක ය. 2016 දී කි.ග්‍රෑ. මිලියන 288.7ක් වූ තේ අපනයන තොගය 2017 දී කි.ග්‍රෑ. මිලියන 288.9ක් දක්වා ඉතා සීමිත ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත. කෙසේ වුව ද 2016, 2017 කාලය සලකා බැලීමේ දී කි. ග්‍රෑ. මිලියන 23ක් වූ කුඩා තේ මලු අපනයනය 2017 දී කි.ග්‍රෑ. මිලියන 21.7ක් දක්වා අඩු විය. 2016 සමග සැසඳීමේ දී එය කි.ග්‍රෑ. මිලියන 1.3ක අඩුවක් එනම් 5.69% තෙක් අඩුවීමක් වේ. ලෝකයේ හරිත තේ සඳහා ඉල්ලුමක් පවතිද්දීත් ශ්‍රී ලංකාවෙන් හරිත තේ අපනයනය එතරම් ඉහළ අගයක් නො ගනී. එය 2017 දී වාර්තා වූ කි. ග්‍රෑ. මිලියන 0.8ක් වශයෙනි. කෙසේ වුව ද පෙර වර්ෂය හා සාපේක්ෂ ව සසඳා බලන කළ එය 18.9%ක වර්ධනයක් වේ.

ඒ අනුව, ප්‍රමාණය අතින් සලකා බලන කළ තේ අපනයන ප්‍රමාණයේ සැලකිය යුතු වර්ධනයක් නොමැති වුව ද 2016 තේ අපනයන ආදායම වූ රු. බිලියන 184.07ක

ප්‍රමාණය 2017 වන විට රු. බිලියන 233.3ක් දක්වා රු. බිලියන 48.6කින් (26.3%) වර්ධනය විය. දේශීය මුදල් ඒකකය වන රුපියල්වලින් සලකා බැලීමේ දී මෙම වටිනාකම තේ අපනයනවලින් ලබා ගත් ඉහළ ම ආදායම වන අතර එයට කලින් එම වාර්තාව වූයේ 2014 දී රු. බිලියන 212.5කි. 2017 දී තේ කිලෝ ග්‍රෑම් 01ක් සඳහා සාමාන්‍යය “නැව තෙක් නොමිලේ” (Free on Board - FOB) මිල රු. 807.44ක් වූ අතර එය 2016 දී රු. 639.88ක් විය. එය අපනයනකරුවන්ට ඉතා හොඳ මිලක් වූ අතර ඒ සඳහා විශේෂයෙන් බලපෑවේ ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදිතයේ අඩුවීම, ලෝක වෙළෙඳපොළේ පැවති කළු තේවල හිඟතාව යනාදිය වේ. ඒ අනුව 2016, 2017 යන වසරවල ශ්‍රී ලංකික තේ අපනයනකරුවන්ට ඉතා හිතකර විය. ශ්‍රී ලංකා තේ අපනයනකරුවන්ගේ සංගමයේ වාර්තාවන්ට අනුව ශ්‍රී ලංකාවෙන් වැඩි ම තේ ප්‍රමාණයක් ආනයනය කර ඇත්තේ තුර්කි රාජ්‍යයයි. එය කි.ග්‍රෑ. මිලියන 37.8ක් වේ. ඉන් අනතුරුව පිළිවෙළින් ඉරාකය කි.ග්‍රෑ. මිලියන 35ක් ද රුසියාව කි.ග්‍රෑ. මිලියන 33.3ක් ද ඉරානය කි.ග්‍රෑ. මිලියන 27.4ක් ද වශයෙනි. මෙහි විශේෂත්වය වනුයේ දීර්ඝ කාලයක්

**5 වන වගුව - ශ්‍රී ලංකාවේ තේ මිලදී ගනු ලැබූ රටවල්**

| රට | 2017 | 2016 | වෙනස | | මුළු අපනයන | |
|---|---|---|---|---|---|---|
| | | | ප්‍රමාණය | % | 2017 | 2016 |
| තුර්කිය | 37.81 | 27.06 | 10.75 | 39.72 | 13.6 | 9.6 |
| ඉරාකය | 34.94 | 32.41 | 2.53 | 7.81 | 12.6 | 11.5 |
| රුසියාව | 32.79 | 34.08 | -1.28 | -3.77 | 11.8 | 12.1 |
| ඉරානය | 27.04 | 33.6 | -6.56 | -19.52 | 9.7 | 12 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 15.23 | 17.83 | -2.6 | -14.6 | 5.5 | 6.3 |
| අසර්බයිජාන් | 12.27 | 10.54 | 1.73 | 16.37 | 4.4 | 3.8 |
| ලිබියාව | 10.83 | 12.62 | -1.78 | -14.14 | 3.9 | 4.5 |
| චීනය | 9.47 | 7.46 | 2.01 | 26.93 | 3.4 | 2.7 |
| ජපානය | 7.82 | 7.67 | 0.15 | 2.02 | 2.8 | 2.7 |
| සිරියාව | 7.28 | 11.96 | -4.69 | -39.18 | 2.6 | 4.3 |
| මුළු අපනයන | 195.48 | 195.2 | 0.25 | 0.13 | 70.3 | 69.5 |

**6 වන වගුව - තේ නිෂ්පාදිත අපනයන සැසඳීම**

| වර්ගය | 2017 | | | 2016 | | | වෙනස | | | වෙනස % | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | FOB | වටිනාකම | ප්‍රමාණය | FOB | වටිනාකම | ප්‍රමාණය | FOB | වටිනාකම | ප්‍රමාණය | FOB |
| තොග | 169.4 | 725.25 | 122,825.00 | 171.78 | 543.72 | 93,400.00 | -2.4 | 181.53 | 29,426.00 | -1.41 | 33.39 |
| ඇසුරුම් | 86.51 | 792.79 | 68,583.00 | 85.02 | 628.93 | 53,471.00 | 1.5 | 163.85 | 15,112.00 | 1.75 | 26.05 |
| තේ මලු | 17.81 | 1,382.51 | 24,619.00 | 19.62 | 1,199.13 | 23,530.00 | -1.8 | 183.38 | 1,088.00 | -9.25 | 15.29 |
| ක්ෂණික | 2.12 | 1,250.83 | 2,651.00 | 2.01 | 1,215.57 | 2,443.00 | 0.1 | 35.26 | 208.00 | 5.47 | 2.9 |
| හරිත තේ | 2.4 | 1,538.90 | 3,697.00 | 2.44 | 1,386.60 | 3,388.00 | 0 | 152.30 | 309.00 | -1.67 | 10.98 |
| උප එකතුව | 278.2 | 799.35 | 222,376.00 | 280.87 | 627.44 | 176,232.00 | -2.7 | 171.91 | 46,144.00 | -0.95 | 27.4 |
| ප්‍රති අපනයනය | 10.79 | 1,016.08 | 10,963.00 | 7.9 | 1,082.23 | 8,546.00 | 2.9 | -66.15 | 2,417.00 | 36.63 | -6.11 |
| **එකතුව** | **289** | **807.44** | **233,338.00** | **288.77** | **639.88** | **184,778.00** | **0.2** | **167.56** | **48,560.00** | **0.07** | **26.19** |

මූලාශ්‍රයඃ Tea Market Update Volume 13" No. 04 - ශ්‍රී ලංකා තේ මණ්ඩලය

පුරා ලංකාවේ තේ සඳහා ප්‍රධාන ම ගනුදෙනුකරුවා වූ රුසියාව තුන්වන ස්ථානයට පහත බැසීමයි. 2017 වසරේ දී ශ්‍රී ලංකාවේ ප්‍රධාන තේ මිලදී ගනු ලැබූ රටවල් 5 වන වගුවේ දැක්වේ.

2017 වසරේ දී තේ අපනයන දත්තයන් සලකා බැලීමේ දී කුඩා තේ මලු සඳහා වන ඉල්ලුම් ප්‍රමාණය 9.25කින් හෙවත් කි.ග්‍රෑ. මෙට්‍රික් ටොන් 1.8කින් අඩු වීම සුවිශේෂී වේ. තොග තේ අපනයනයේ ඉහළ වර්ධනයක් දැක ගත හැකි අතර එය FOB ඒකක අගය 33%කින් වැඩි වීමක් විය. 2016 වසර හා සාපේක්ෂ ව තේ නිෂ්පාදිත අපනයනයන්හි සැසඳීමක් 6 වන වගුවේ දැක්වේ.

විශේෂයෙන් සිරියාව සහ ලිබියාව වැනි රටවල පවත්නා ගැටුම් සහගත තත්ත්වය නිසා කලින් එම රටවල පැවති තේ අපනයන වෙළෙඳපොළ ශ්‍රී ලංකාවට අහිමි වී ඇත. ඒ අනුව සිරියාවට සිදු කරන ලද තේ අපනයන ප්‍රමාණය 2016 දී මෙට්‍රික් ටොන් 11.96 සිට 2017 දී 7.28ක් දක්වා 4.69%කින් පහළ බැස ඇත. එ සේ ම ලිබියාව 2010 දී කිලෝග්‍රෑම් මෙට්‍රික් ටොන් 12.62 සිට 2017 දී කිලෝග්‍රෑම් මෙට්‍රික් ටොන් 10.83ක් දක්වා 1.78%කින් පහළ බැස ඇත. ඒ අනුව, ඉතිහාසයේ පළමු වරට තුර්කිය ලංකා තේ සඳහා ප්‍රමුඛතම ආනයනකරුවෙකු බවට පත් ව සිටී.

ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන් නිෂ්පාදනය කරනුයේ සාම්ප්‍රදායික (Orthodox) තේ ය. එ සේ ම සාම්ප්‍රදායික නොවන (Unorthodox) ක්‍රමයෙන් තෝරා නිෂ්පාදනය කරනු ලබන තේ (Cut Tea and Curl - CTC) වේ. එ සේම හරිත තේ, ක්ෂණික තේ, ජීවී තේ (Bio Tea) සහ රස ගන්වන ලද තේ ද ලංකාවේ නිෂ්පාදනය කරනු ලැබේ. රසය සහ සුවඳ නිසා කඳුකර ප්‍රදේශවල හැදෙන තේ ජනප්‍රිය වී ඇත. විශේෂයෙන් දිඹුල සහ නුවරඑළිය යන ප්‍රදේශවල හැදෙන මෙම තේ සඳහා ඉහළ ජනප්‍රියතාවක් ඇත. එ සේ ම තේ අපනයනය කිරීමේ දී කුඩා තේ මලු, තේ පැකට්, තේ තොග, ක්ෂණික තේ, හරිත තේ , රස ගන්වන ලද තේ යනාදී ලෙස සකස් කර අපනයනය කරනු ලබයි. ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය වන ප්‍රදේශ ප්‍රධාන කාණ්ඩ 3ක් යටතේ වර්ගීකරණය කරනු ලබයි. (මූලාශ්‍රයː Industry Capability Report 2016 - EDB).

### වගා කෙරෙන ප්‍රදේශය අනුව තේ වර්ගීකරණය

**උඩරට/ඉහළ කඳුකර තේ:**
මුහුදු මට්ටමෙන් මීටර් 1200ක් වන උස

- නුවරඑළිය - මනා සුවදැති රසවත් (Delicately Fragrant)
- උඩපුස්සැල්ලාව - ඉතා ප්‍රණීත රස (Exquisitely tangy)
- ඌව - විචිත්‍ර සුවදැති (Exotically aromatic)
- දිඹුල - නැවුම් ප්‍රසන්න (Refreshingly mellow)

**මැදරට තේ :**
මුහුදු මට්ටමෙන් මීටර් 600 - මීටර් 1200

- මහනුවර - තීව්‍ර උසස් ගුණයෙන් යුත් (Intensely full-bodied)

**පහතරට තේ :**
මුහුදු මට්ටමේ සිට මීටර් 600 ට වඩා පහළ


- සබරගමුව - සෞම්‍ය උසස් ගුණයෙන් යුත් (Smooth & full-bodied)
- රුහුණ - විශිෂ්ට අද්විතීය වූ (Distinctively Unique)

නැගෙනහිර කඳුකර ප්‍රදේශවලින් නෙළා ගනු ලබන ඌව තේ විශේෂිත සෘතුමය ලක්ෂණවලින් සමන්විත වන අතර විශේෂයෙන් ජර්මනිය සහ ජපානය යන රටවල බහුල ව භාවිත වේ. තද පැහැයකින් යුත් තේ, ඕස්ට්‍රේලියාව, යුරෝපය, ජපානය සහ උතුරු ඇමරිකාව යන රටවල ජනප්‍රිය පානයක් වේ. පහතරට තේ විශේෂයෙන් බටහිර ආසියානු රටවල, මධ්‍යම හා නැගෙනහිර යුරෝපීය රටවල, පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල හා බ්‍රික්ස් කණ්ඩායමේ රටවල ජනප්‍රිය පානයකි.

පහතරට තේ කර්මාන්තය තුළ ගාල්ල, මාතර දිස්ත්‍රික්ක සුවිශේෂී දායකත්වයක් උසුලයි. දකුණු පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද 2016 සංඛ්‍යාන නිබන්ධනයේ සඳහන් වන පරිදි ගාල්ල දිස්ත්‍රික්කයේ තේ වගා කර ඇති බිම් ප්‍රමාණය හෙක්ටයාර් 27,125ක් වන අතර මාතර දිස්ත්‍රික්කයේ හෙක්ටයාර් 23,800ක් පමණ වේ. හෙක්ටයර් 803ක පමණ බිම් ප්‍රමාණයක හම්බන්තොට දිස්ත්‍රික්කයේ තේ වගාව සිදු කර තිබුණ ද එහි පවතින වියලි කාලගුණික තත්ත්වය තේ වගාවට එතරම් යෝග්‍ය නො වේ.

විශේෂයෙන් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල තේ වගාවට අවශ්‍ය යෝග්‍ය දේශගුණික තත්ත්වයක් දැක ගත හැකි ය (උදා. මි.මි. 2500 - මි.මි. 3000 අතර

**6 වන රූප සටහන - දකුණු පළාතේ තේ වගාව සිදු කරනු ලබන බිම් ප්‍රමාණය**





මූලාශ්‍රය-: දකුණු පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද 2016 සංඛ්‍යාන නිබන්ධනය

**7 වන වගුව - 2017 වසරේ තේ නිෂ්පාදනය කි.ග්‍රෑ.**

| | කළු තේ | හරිත තේ | එකතුව |
|---|---|---|---|
| උඩරට | 63,667,840 | 975,757 | 64,643,597 |
| මැදරට | 44,077,411 | 1,577,181 | 45,654,592 |
| පහතරට | 197,312,801 | 108,816 | 197,421,617 |
| **එකතුව** | **305,058,052** | **2,661,754** | **307,719,806** |

මූලාශ්‍රය -: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**7 වන රූප සටහන - 2017 වර්ෂයේ දී තේ නිෂ්පාදනය කි.ග්‍රෑ.**




මූලාශ්‍රය-: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**8 වන වගුව - සමස්ත තේ නිෂ්පාදනය (කි.ග්‍රෑ.)**

| | 2016 | 2017 |
|---|---|---|
| උඩරට | 64,424,774 | 64,643,597 |
| මැදරට | 44,510,198 | 45,654,592 |
| පහතරට | 183,638,644 | 197,421,616 |
| **එකතුව** | **292,573,586** | **307,719,805** |

මූලාශ්‍රය -: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

වාර්ෂික වර්ෂාපතනය, සෙල්සියස් අංශක 22 - 27ක් අතර උෂ්ණත්වය, ප්‍රමාණවත් හිරුඑළිය).

ඒ අනුව 2017 වර්ෂයේ සමස්ත කළු තේ නිෂ්පාදනයෙන් 64.7%ක් සඳහා දායකත්වය සපයා ඇත්තේ පහතරට තේ නිෂ්පාදකයින් ය. නමුත් හරිත තේ සඳහා පහතරට තේ නිෂ්පාදකයන්ගේ දායකත්වය වී ඇත්තේ 4.1%ක් පමණි. ඒ අනුව සමස්ත තේ නිෂ්පාදනයෙන් 64.2%ක අතිවිශිෂ්ට දායකත්වයක් පහතරට තේ නිෂ්පාදනය මගින් සිදු වී ඇත.

ඒ අනුව 2016 වසර සමඟ සසදා බැලූ විට පහතරට තේ නිෂ්පාදනය 7.5%කින්, එනම් කිලෝ ග්‍රෑම් 13,782,972ක ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත.

**සිංහ සළකුණ**

තේ පැකට්වල සඳහන් වන සිංහ සලකුණ එය නිෂ්පාදනය කරන රට පිළිබඳ ව වන සටහනක් පමණක් ම නො වන අතර එය තේවල ගුණත්වය පිළිබඳ සහතිකයක් ද වේ. ලෝකය පුරා රටවල් බොහොමයක ලියාපදිංචි වී ඇති මෙම සලකුණෙහි අයිතිකරු ශ්‍රී ලංකා තේ මණ්ඩලයයි. පහත සඳහන් මාර්ගෝපදේශවලට යටත් ව සිංහ සලකුණ භාවිතය සඳහා යොදා ගත හැකි ය.

I. ලංකා තේ පාරිභෝගික ඇසුරුම්වල පමණක් මෙම ලාංඡනය භාවිත කළ හැකි ය.

II. එම ඇසුරුම් 100% ශුද්ධ ලංකා තේවලින් සමන්විත විය යුතු ය.

III. විවිධ සන්නාම යටතේ වුව ද සිංහ සලකුණු පාවිච්චි කරන විට ඒවා ශ්‍රී ලංකාවේ ඇසුරුම් කරන ලද තේ විය යුතු ය. ශුද්ධ ලංකා තේ ඇතුළත් ඇසුරුම් සඳහා වුව ද විදේශීය ආනයනකරුවන්/ඇසුරුම්කරුවන් හට මෙම සළකුණ භාවිතයට අවසර නොමැත.

IV. සිංහ සලකුණ භාවිත කරන සමාගම් විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් නිර්ණය කරන ලද ප්‍රමිති සම්මතයන්ට අනුකූල ව එය සිදු කළ යුතු ය.

## ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන

I. **ශ්‍රී ලංකා තේ මණ්ඩලය (Sri Lanka Tea Board - SLTB)**: තේ සම්බන්ධ නියාමන කටයුතු, සංවර්ධන කටයුතු සහ ප්‍රවර්ධන කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය කටයුතු කරන අතර එය 1976 වර්ෂයේ දී පිහිටුවන ලදි.

II. **තේ පර්යේෂණ ආයතනය (Tea Research Institute - TRI)**: තේ වගා කටයුතු සම්බන්ධයෙන් පර්යේෂණ කරන මූලික ආයතනය වනුයේ තේ පර්යේෂණ ආයතනය වේ. එය තලවාකැලේ පිහිටා ඇත. තේ පර්යේෂණ ආයතනයේ පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය රත්නපුර දිස්ත්‍රික්කයේ ද මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය මහනුවර දිස්ත්‍රික්කයේ ද ඌව ව්‍යාපෘති මධ්‍යස්ථානය බදුල්ල දිස්ත්‍රික්කයේ ද අනෙකුත් ව්‍යාපෘති මධ්‍යස්ථාන ගාල්ල, දෙනියාය, කළුතර යන ප්‍රදේශවල ද පිහිටා ඇත.

III. **කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය (Tea Small Holdings Development Authority - TSHDA)**: කුඩා තේ වතු හිමියන් ඉලක්ක කර ගනිමින් ඔවුන්ට සහයෝගය දැක්වීම සඳහා හඳුන්වා දුන් ආයතනය වනුයේ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වේ. මෙම ආයතනය අර්ධ රාජ්‍ය ආයතනයක් ලෙස 1975 දී බිහි විය. අක්කර 50කට වඩා අඩු පුද්ගලික අංශයේ වගා හිමියන් මෙම ආයතනයේ සහයෝගය ලැබීම සඳහා සුදුසුකම් ලැබී ය.

IV. **ලංකා වැවිලිකරුවන්ගේ සංගමය (Planters' Association of Ceylon - PAC)**: 1854 දී බිහි

වූ මෙම ආයතනය විශේෂයෙන් වතු සමාගම් සහ පෞද්ගලික තේ වගාකරුවන් සඳහා අතහිත ලබා දෙයි.

V. **කොළඹ තේ වෙළෙඳුන්ගේ සංගමය (The Colombo Tea Traders' Association - CTTA)**: 1894 දී බිහි වූ මෙම ආයතනය තේ මිලදී ගන්නන්ගෙන් සහ විකුණුම්කරුවන්ගෙන් සමන්විත වේ. මෙම ආයතනය විසින් කොළඹ තේ වෙන්දේසිය කළමනාකරණය කරනු ලබයි.

VI. **පෞද්ගලික තේ කර්මාන්ත හිමියන්ගේ සංගමය (Private Tea Factory Owners Association - PTFOA)**: තේ කර්මාන්තයේ අයිතිය තහවුරු කර ගැනීම තුළින් තේ වගාව ආරක්ෂා කර ගැනීම සඳහා 1982 දී මෙම සංගමය බිහි විය.

VII. **තේ අපනයනකරුවන්ගේ සංගමය (Tea Exporter Association-TEA)**: තේ අපනයනකරුවන් මුහුණ දෙන අභියෝග ජය ගැනීමේ අභිලාශයෙන් 1989 දී මෙම සංගමය බිහි විය.

## ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය මුහුණ දෙන ප්‍රධාන අභියෝග

තේ වගා බිම් පෞද්ගලිකරණය මෙන් ම වෙනත් තත්ත්වයන් හේතුවෙන් තේ කර්මාන්තය ප්‍රබල වෙනස්කම් රැසකට මුහුණ දී ඇත. මෙසේ සිදු වූ ව්‍යුහාත්මක වෙනස්කම් විසින් තේ කර්මාන්තය අභියෝගයකට ලක් කෙරෙමින් පවතී. ඒ අනුව පුහුණුව හා සංවර්ධනය වැනි තත්ත්වයන් අපහසු වී ඇති අතර නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම, සේවක වැටුප් ගැටලු වැනි දැඩි අභියෝගයන්ට මුහුණ දීමට සිදු වේ. අන්තර්ජාතික තේ වෙළෙඳපොළ තුළ ඇති වී ඇති දැඩි තරගකාරීත්වය, තේ අපනයන වෙළෙඳපොළ සඳහා නව සැපයුම්කරුවන් පැමිණීම, තේ සඳහා විකල්ප පානීය වර්ග බිහිවීම මෙන් ම තවත් හේතු බොහොමයක් නිසා තේ නිෂ්පාදනය අභියෝගාත්මක වී ඇතිවාක් මෙන් ම තේවල ගුණත්වය සහ ප්‍රමාණය සම්බන්ධයෙන් ද ගැටලු මතු වී ඇත. ඒ අනුව, වසර 150ක් පුරා දිවෙන තේ කර්මාන්තය අද වන විට අභියෝග රැසකට මුහුණ පාමින් සිටි.

1. **ලෝකයේ අලුතින් තේ වගා කරන රටවල් බිහි වීම සහ අනෙකුත් තේ නිෂ්පාදනය කරන රටවල්වලින් එල්ල වන දැඩි තරගකාරී පීඩනය සහ වෙළෙඳපොළ ප්‍රමුඛතාව ගිලිහී යෑම**

චීනය, ඉන්දියාව, කෙන්යාව, ශ්‍රී ලංකාව, ඉන්දුනීසියාව වැනි රටවල් දශක ගණනාවක් පුරා තේ වෙළෙඳපොළ ආක්‍රමණය කර ගෙන සිටිය ද ලෝකයේ අලුතෙන් තේ වගා කරන රටවල්වල සම්ප්‍රාප්තිය සමග අද වන විට දැඩි තරගකාරී තත්ත්වයන් මතු ව ඇත. විශේෂයෙන් ම මැලේසියාව, ආජන්ටිනාව, බ්‍රසීලය, උගන්ඩාව, කියුබාව වැනි රටවල් අද වන විට ප්‍රබල තර්ජනයක් එල්ල කරමින් සිටී. 2014 වසරේ දී ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරනු ලබන ප්‍රධානතම රට වූ රුසියාව 2017 අවසාන වන විට දෙවැනි තැනට පත් ව ඇත. ජාත්‍යන්තර ව්‍යාපාර සංවර්ධනය සඳහා වන වෙළෙඳ සංඛ්‍යා ලේඛනවල දැක්වෙන පරිදි 20%ක පමණ තේ ඉල්ලුමේ අඩුවීමක් දැක ගත හැකි ය. එ සේ ම 2010 වසරේ දී ශ්‍රී ලංකාවේ තේ සඳහා ඉතා ම ඉහළ ඉල්ලුමක් පැවති එක්සත් අරාබි එමීර් රාජ්‍යය අද වන විට 40%ක් පමණ දක්වා සිය ඉල්ලුම අඩු කර ඇත. තව ද සිරියාවේ පවතින දැඩි යුදමය වාතාවරණය හේතුවෙන් 2011 වන විට ලංකාවේ තේ සඳහා ඉතා ම හොඳ තත්ත්වයක පැවති සිරියානු තේ ඉල්ලුම අද වන විට 60%කටත් වඩා පහත බැස ඇත. ප්‍රධාන තේ නිෂ්පාදකයන් වන්නේ චීනය, ඉන්දියාව, ශ්‍රී ලංකාව, කෙන්යාව සහ තුර්කිය වේ (Trade Map, FAO IGG Secretariat).

මෑත කාලීන ව ලෝක තේ නිෂ්පාදනය තුළ චීනය, ඉන්දියාව, ශ්‍රී ලංකාව, කෙන්යාව සහ තුර්කිය වැනි රටවල් තේ නිෂ්පාදනයේ ප්‍රමුඛතම රටවල් අතර සිටිය ද සමහර රටවල් සම්බන්ධයෙන් එම ආධිපත්‍යය ක්‍රමයෙන් ගිලිහී යමින් පවතී. 2003 වර්ෂයේ දී ලෝක තේ නිෂ්පාදනයෙන් 27.4%ක් ඉන්දියාව නිෂ්පාදනය කරන ලද අතර 24.6%ක් චීනය ද, 9.75%ක් ශ්‍රී ලංකාව, ද 9.4%ක් කෙන්යාව ද නිෂ්පාදනය කරන ලදි. 2013 වර්ෂය වන විට ඉන්දියාව අභිබවා යමින් චීනය ලෝක තේ නිෂ්පාදනයේ ප්‍රමුඛතමයා බවට පත් වෙමින් ලෝක තේ නිෂ්පාදනයෙන් 38.0%ක් නිෂ්පාදනය කරනු දැක ගත හැකි ය. 2003 දී 9.75%ක් ව පැවති ලෝක තේ නිෂ්පාදනය සඳහා ශ්‍රී ලංකාවේ දායකත්වය 2013 වන විට ලෝක තේ නිෂ්පාදනයෙන් 6.77%ක් දක්වා පහත වැටී ඇත (මූලාශ්‍රය-FAO NEWS Room). විශේෂයෙන් ම වියට්නාමය, කියුබාව, ආර්ජන්ටිනාව, බ්‍රසීලය, පේරු, උගන්ඩාව, බංගලාදේශය, මැලේසියාව වැනි රටවල් සිය තේ නිෂ්පාදනය වර්ධනය කර ඇත.

2. **ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත තේවල ගුණාත්මක බව ක්‍රම ක්‍රමයෙන් පිරිහී යෑම**

විශේෂයෙන් ලංකාවේ පවත්නා දේශගුණික තත්ත්වයන්, පසෙහි පවත්නා සාරවත්බව යනාදිය නිසා ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත තේ රසයට විදේශයන්ගේ ඉහළ ඉල්ලුමක් පවතී. ඉහළ ප්‍රමිතියෙන් යුතු තේ පාන සඳහා අවශ්‍ය ඉහළ සම්මතයකින් යුතු තේ කොළ සඳහා තේ වෙන්දේසියේ දී ඉහළ වටිනාකමක් ලැබේ. කෙසේ වුව ද වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ තේවල ගුණත්වය සම්බන්ධයෙන් සිදු වන කතා බහ ශ්‍රී ලාංකීය තේ කර්මාන්තයට එතරම් හිතකර තත්ත්වයක් ඇති නො කරයි.

විශේෂයෙන් ප්‍රමිතිගත පොහොර භාවිත නො කිරීම, නිසි නඩත්තුවක් සිදු නො වීම, නැවත වගාවේ පවතින දුර්වලතා, සේවක හිඟය, නිසි ප්‍රමිතියකින් තොර වූ තේ දළු කර්මාන්ත ශාලාවලින් භාර ගැනීම, යාවත්කාලීන නො වූ තේ සැකැසීමේ ක්‍රියාවලීන්, ප්‍රතික්ෂේප වූ තේ නැවත සැකසීම, නියාමන ක්‍රමවේදය ශක්තිමත් නො වීම, ශ්‍රම හිඟය යනාදිය හේතුවෙන් තේවල ගුණත්වය පහත ගොස් ඇත. එ සේ ම තේ සඳහා සීනි කලවම් කිරීම් වැනි මෑතක දී හෙළිදරව් වූ තත්ත්වයන් ඉදිරියේ දී අපනයන වෙළෙඳපොළ සඳහා දැඩි බලපෑම් ඇති කරනු ඇත.

අධික ලාභ ලබා ගැනීමේ අරමුණකින් තේ කර්මාන්තයට ඇතුළු වන සමහර පුද්ගලයන් විසින් හොඳ තේ සඳහා කුඩු තේ මිශ්‍ර කිරීම, ව්‍යාජ ලේබල් ඇලවීම, තේ සඳහා වර්ණක යෙදීම, මිනිස් ශරීරයට නුසුදුසු පොහොර වර්ග භාවිතය වැනි කරුණු නිසා ද ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය අභියෝග රැසකට මුහුණ දී සිටී.

3. **භූමියේ ඵලදායීත්වය අඩු වීම**

තේ නිෂ්පාදනයේ ඵලදායීත්වය අඩු වීම අද වන විට ශ්‍රී ලංකාව මුහුණ දෙන සංකීර්ණ ගැටලුවක් බවට පත් වී ඇත. කෙන්යාව, ඉන්දියාව, ඉන්දුනීසියාව වැනි තේ නිෂ්පාදනය කරනු ලබන ප්‍රධාන රටවල් හා සැසඳීමේ දී ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ සාමාන්‍ය ඵලදායීත්වය පහළ අගයක් ගනී. විශේෂයෙන් ම දීර්ඝ කාලයකින් නැවත වගා නො කිරීම, ප්‍රමාණවත් ලෙස නැවත වගා නො කිරීම, ප්‍රමාණවත් තරම් පොහොර සහ ගුණාත්මක පොහොර භාවිත නො කිරීම, ග්ලයිෆොසෙට් වැනි පොහොර භාවිතය තහනම, සම්ප්‍රදායික තේ වර්ග වගා කිරීම, පස සේදී යෑම සහ පස සාරවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නො ගැනීම, අධික ශ්‍රමික වියදම්, ප්‍රමාණවත් තරම් සේවකයන් නොමැති වීම, තාක්ෂණික දියුණුවේ මඳ බව, ඉහළ නිෂ්පාදන පිරිවැය සහ අඩු ලාභදායීත්වය යනාදී සාධක මෙම ඵලදායීත්වය අඩු වීමට කෙළින් ම බලපා ඇත.

තේ නිෂ්පාදනය කරනු ලබන අනෙකුත් රටවල් සමඟ සංසන්දනය කිරීමේ දී ශ්‍රී ලංකාව ලබා ගෙන ඇති භූමිය සඳහා වන ඵලදායීත්ව මට්ටම පිළිබඳ සෑහීමකට පත් විය නො හැකි ය. කෙසේ වුව ද කුඩා පරිමාණ තේ වගාකරුවන් සහ මහා පරිමාණ තේ වගාකරුවන් සංසන්දනය කිරීමේ දී තේ භූමියේ ඵලදායීත්වය අතර ඉතාමත් සැලකිය යුතු වෙනස්කම් පවතී. භූමියේ ඵලදායීත්වය අඩු වී යෑමට ප්‍රධාන හේතු ලෙස පහත සඳහන් කරුණු දැක්විය හැකි ය.

i. **භූමිය පූර්ණ ලෙස වගා කර නො තිබීම සහ නිසි භූමි පරිහරණ රටාවක් නොමැති වීම**

තේ වගා කරනු ලබන ඉඩම් තුළ වගා කර නොමැති ඉඩම් බොහොමයක් දැක ගත හැකි ය. එවැනි හිස් ඉඩකඩ තේ පඳුරුවල ඝනත්වය අඩු වීමට හේතු වන අතර එය සෘජු ව ම භූමියේ ඵලදායීත්වයේ අඩු වීමට බලපායි.

ii. **නැවත වගාව නිසි පරිදි සිදු නො කිරීම**

බොහෝ තේ වතු නඩත්තුව සම්බන්ධයෙන් සෑහීමකට පත් විය නො හැකි ය. එයට හේතුව වන්නේ ඉතා විශාල ඵලදායීත්වයක් ගත හැකි පරිදි නැවත වගාව සිදු කළ හැකි වුව ද ඒ සඳහා ඉතා විශාල ආයෝජනයක් සිදු කළ යුතු වීම, ශ්‍රමයේ හිඟකම, නැවත තේ දළු නෙලීම සඳහා සැලකිය යුතු කාලයක් ගත වීම, නැවත වගාව සඳහා දෙන සහන අඩු වීම යනාදිය වේ (අමරසූරිය, 2012).

සෑම ඉඩමක් ම තේ වගාවට උචිත නො වේ. නමුත් මෑත කාලීන ව ඇති වූ තේ ඉඩම්වල හිඟතාව හේතුවෙන් තේ වගාවට කිසිසේත්

සුදුසු නො වන බිම් තේ වගාව සඳහා වගාකරුවන් විසින් යොදා ගෙන ඇති බව දැක ගත හැකි ය. විශේෂයෙන් අධික බොරළු පස් සහිත බිම්, ගංවතුර නිසි ලෙස බැස නො යන බිම්, අඩු පාංශු ගැඹුරක්, අඩු පාංශු කාබනික ස්ථරයක් සහිත බිම් භාවිතය නිසි ලෙස භූමිය පරිහරණය කර නොමැති බවට නිදසුන් ය.

iii. **දුර්වල කෘෂිකාර්මික පරිචයන් සහ යහපත් කෘෂිකාර්මික පරිචයන්ගෙන් ඈත් වීම.**

භූමියෙන් වඩා හොඳ ඵලදායීත්වයක් ලබා ගැනීමට නම් නිවැරදි කලට සුදුසු පොහොර අනුගමනය කරති. මෙවැනි නිසි බිම් සැකසීමක් සිදු නො කිරීම තුළ කලින් වගාවේ මුල් පස තුළ ඉතිරි වීමෙන් නව වගාවට දිලීර රෝග පහසුවෙන් සම්ප්‍රේෂණය වීමේ ඉතා ම වැඩි අවදානමක් පවතී. එ සේ ම නව වගාවේ මුල් වර්ධනය වීම සඳහාත් එය දැඩි ව බලපායි.

iv. **ප්‍රමිතියෙන් තොර දුර්වල තවාන් පැළ භාවිතය**

ප්‍රමිතියෙන් තොර දුර්වල තවාන් පැළ භාවිතය ද භූමියේ ඵලදායීත්වය පහත දැමීමට හේතු වී ඇත. එ සේ භාවිත කරන බොහෝ පැළ බිම් පැළ වන අතර ඒවා දුර්වල පැළ වේ. එ සේ ම

**වගුව 09 - තේ නිෂ්පාදනය (තේ ටොන් දහස්)**

| | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| ලෝක තේ නිෂ්පාදනය | 4784.5 | 5063.9 | 5,195.0 | 5285.0 | 5,945.1 |
| චීනය | 1789.8 | 1924.5 | 2,095.6 | 2,278.0 | 2,414,8 |
| ඉන්දියාව | 1129.0 | 1200.4 | 1,207.3 | 1,208.7 | 1,252.2 |
| ශ්‍රී ලංකාව | 328.4 | 343.1 | 338.0 | 328.9 | 349.3 |
| කෙන්යාව | 373.1 | 436.3 | 445.1 | 399.2 | 473.0 |
| තුර්කිය | 225.0 | 227.0 | 226.8 | 258.5 | 243.0 |

මූලාශ්‍රය - FAO IGG Secretariat

යෙදීම කළ යුතු ය. එ සේ ම තේ පඳුරු මනාව නඩත්තු කළ යුතු ය. තේ පර්යේෂණ ආයතනයේ 2010 වාර්ෂික වාර්තාව සඳහන් කරන පරිදි වසර සියයකට අධික කාලයක් පුරා අනුගමනය කළ තේ වගා පරිචයන් හේතුවෙන් පසෙහි සාරවත්භාවයට ද බලපෑමක් එල්ල වී ඇත. ක්ෂේත්‍රයේ නිවැරදි කෘෂි පිළිවෙත් අනුගමනය නො කිරීම හේතුවෙන් තේ පඳුරු දුර්වල වී මිය යෑම සිදු වී ඇත. තව ද අධික ලෙස වල් නාශක භාවිතය ද මෙසේ තේ වගා බිම්වල ඵලදායීත්වය අඩු වීමට ඉවහල් වී ඇත.

නැවත වගාවක දී නම් එය සිදු කළ යුත්තේ නිසි පරිදි බිම් සැකසීමකින් පසුව ය. නමුත් මෙවැනි නිසි පරිදි බිම් සැකසීමක් සිදු නො කොට සෘජු ව ම නැවත වගාවන් සිදු කරන බව ප්‍රකට කරුණකි. කුඩා තේ වතු හිමියෝ විශේෂයෙන් ම මෙවැනි ක්‍රම සමහරවිට මෙම පැළ පළිබෝධ සහ ඌනතා ලක්ෂණවලින් පිරී ඇති බව දැක ගත හැකි ය. මෙම පැළ ක්ෂේත්‍රයේ සිට වූ පසු ඇති වන කර්කශ තත්ත්වයන්ට සාර්ථක ව මුහුණ දී ගත නො හැකි ව දිරා යෑම් වැනි තත්ත්වයන් ඇති විය හැකි ය. එමෙන් ම තවාන් පැළ සඳහා නිසි සෙවණක් නැති වීම ඒවායේ ප්‍රමිතිය අඩු වීමට හේතු වී ඇත.

නිවැරදි කප්පාදු ක්‍රම භාවිත නො කිරීම හේතුවෙන් ඵලදායීත්වය හීන විය හැකි ය. අස්වැන්න වැඩි කර ගැනීමේ අපේක්ෂාවෙන් සමහර තේ වගාකරුවන් තේ ගස් ළඟ ළඟ කප්පාදු කරයි. නමුත් එය එ සේ කළ යුතු නොවේ. එවිට සිදු වනුයේ තේ පඳුරු රාශියක් අහිමි වී යෑම වේ. එ සේ ම කප්පාදු කිරීමේ දී එතරම් සැලකිල්ලක් නො දැක්වීම ද ඵලදායීත්වය අඩු වීමට හේතුවක් වේ. බොහෝ දෙනෙකු නො දන්නා කාරණය වනුයේ

කප්පාදුව කරන අවස්ථාවේ දී ම ශාඛයේ දිරා ගිය කොටස්, පළිබෝධ උවදුරට පත් වූ කොටස් මනාව සොයා බලා ඒවා පිරිසිදු කිරීම අත්‍යවශ්‍ය සාධකයක් බවයි. එ සේ සිදු නො කර එම තත්ත්වයන් වර්ධනය වීමට ඉඩ හැරීමෙන් යම් දිනෙක ඒවා පිරිසිදු කළ නො හැකි තත්ත්වයක් දක්වා වර්ධනය වේ.

### 4. ශ්‍රම ඵලදායීත්වය හීන වීම

භූමියේ ඵලදායීත්වය අඩු වීම මෙන් ම ශ්‍රමයේ ඵලදායීත්වය අඩු වීම ද තේ වගාව සඳහා තර්ජනයක් ව පවතී. අනෙකුත් තේ වගා කරන රටවල්වල ශ්‍රම ඵලදායීත්වය සංසන්දනය කිරීමේ දී ශ්‍රී ලංකාවේ ශ්‍රම ඵලදායීත්වය සතුටුදායක මට්ටමක නො පවතී.

නමුත් ප්‍රාදේශීය වතු සමාගම් සමඟ සැසඳීමේ දී කුඩා තේ වගාකරුවන් වැඩි ශ්‍රම ඵලදායීත්වයකින් යුක්ත බව දැක ගත හැකි ය. කුඩා තේ වතු හිමියන් බොහෝ විට ශ්‍රමය කුලියට ගන්නා අතර නෙළනු ලැබූ තේ දළුවල බර අනුව ගෙවීම් සිදු කරයි. නමුත් ප්‍රාදේශීය වතු සමාගම්වල සහ තේ වතුවල තත්ත්වය එ සේ නො වේ. සමහර වතුවල ප්‍රමාණය ඉක්මවා ගිය සේවක පිරිසක් වැඩ කරන බව දැක ගත හැකි ය. එ සේ ම ශ්‍රමය සඳහා කාර්යඵල මැනීමේ ක්‍රමවේදයක් භාවිත නො කරයි. මෙම වතුවල වෘත්තීය සමිති ඉතා ප්‍රබල වන අතර එදිනෙදා කටයුතුවල දී ඔවුන්ගේ බලපෑම් මත ද ශ්‍රම ඵලදායීත්වය අඩු වී ඇත.

### 5. අඩු තාක්ෂණික ක්‍රමවේද භාවිතය

ශ්‍රී ලංකාව වසර 150ක් ඉක්මවා තේ නිෂ්පාදනය සඳහා උරුමකම් කීව ද තේ නිෂ්පාදනය සඳහා භාවිත කරන තාක්ෂණය වෙනස් වී ඇත්තේ ඉතාමත් සුළු වශයෙනි. කර්මාන්තශාලා බොහොමයක් යල් පැන ගිය යන්ත්‍ර භාවිත කරමින් නිෂ්පාදනය තුළ රැඳී සිටී. නවීන යන්ත්‍ර සූත්‍ර වෙළෙඳපොළට එන වේගය ද අඩු මට්ටමක පවතින අතර එම යන්ත්‍ර සූත්‍ර පිළිගැනීමට ද වගාකරුවෝ මැලිකමක් දක්වති. විශේෂයෙන් මැරීම, ඇඹරීම, වියළීම හා හැලීම සඳහා තවමත් භාවිත කරන්නේ සම්ප්‍රදායික මෙවලම් ය.

එ සේ ම තාක්ෂණය නිසි ලෙස දියුණු නො වීම නිසා අපතේ යන තාප ප්‍රමාණය ඉතා අධික ය. එම්. ජී. එම්. ෆොන්සේකා මහතා (ලක්බිම-2008) දක්වන පරිදි පහතරට තේ නිපදවීමට නිර්දේශිත සිදුරු විශ්කම්භය පවත්වා නො ගැනීම හේතුවෙන් ෆැරන්හයිට් අංශක 210කින් කළ යුතු වියළීම සඳහා මේ වන විට ෆැරන්හයිට් අංශක 240ක උෂ්ණත්වයක් ලබා දීමට සිදු වී තිබේ. ඒ අනුව මෙම තත්ත්වය තාපය, විදුලි බලය මෙන් ම මිනිස් ශ්‍රමය ද දැඩි ලෙස අපතේ යෑමකට හේතු වී ඇත.

### 6. ඉහළ ගිය නිෂ්පාදන පිරිවැය

ඉහත සඳහන් කළ තත්ත්වයන් නිෂ්පාදන පිරිවැය සඳහා ඍජු ව ම බලපායි. එ සේ ම ඉන්ධන මිල ගණන් ඉහළ යෑම, වැඩි පඩි ගෙවීමට සිදු වීම, යන්ත්‍රසූත්‍ර ප්‍රතිෂ්ඨාපන පිරිවැය ඉහළ යෑම යනාදී තත්ත්වයන් ද නිෂ්පාදන පිරිවැය ඉහළ නංවයි. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව දක්වන පරිදි තේ නිෂ්පාදනය කරනු ලබන අනෙකුත් රටවල් සමඟ සංසන්දනය කිරීමේ දී ශ්‍රී ලංකාව වැඩි පිරිවැය අතින් අංක 1 හි සිටී. නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම හේතුවෙන් ලෝක තේ වෙළෙඳපොළ තුළ උද්ගත ව ඇති සීතල තරගයට සාර්ථක ව මුහුණ දීම ඉතා ම අපහසු වනු ඇත. එ සේ ම ලාභදායීත්වය අඩු වීම වැනි තත්ත්වයන් නිසා ක්ෂේත්‍රයේ සිටින වගාකරුවන් අධෛර්යට පත්වනවා මෙන් ම නව ආයෝජකයන් ක්ෂේත්‍රයට පැමිණීම ද අධෛර්යමත් කරයි.

### 7. ශ්‍රම හිඟතාව

තේ නිෂ්පාදනයේ නිරත වගාකරුවන් මුහුණ දෙන තවත් ප්‍රධානතම අභියෝගයක් වන්නේ ශ්‍රම හිඟතාවයි. තේ කර්මාන්තය සඳහා ඉතා විශාල ශ්‍රම දායකත්වයක් අවශ්‍ය වේ. ජීවන වියදම් ඉහළ යෑම, ක්ෂේත්‍රයේ පවතින වැටුප් තත්ත්වය සාපේක්ෂ ව පහළ තත්ත්වයක පැවතීම, වෘත්තීය පිළිගැනීමේ ඇති මඳ බව, විශේෂයෙන් සේවයේ නියුතු ව සිටි කාන්තාවන් වෙනත් රැකියා සඳහා යොමු වීම, විදේශීය රටවල රැකියා සඳහා යොමු වීම, නව පරපුර නව මංපෙත් සොයා යෑම වැනි තත්ත්වයන් හේතුවෙන් තේ කර්මාන්තය උග්‍ර ශ්‍රම හිඟයකට මුහුණ පා සිටී. අතීතයේ දී යම් පුද්ගලයකු තේ කර්මාන්ත ශාලාවක වැඩ කරන්නේ නම් ඔහුගේ පවුලේ බොහෝ දෙනා තේ කර්මාන්තශාලා ආශ්‍රිත රැකියාවන්හි නිරත වනු දැක ගත හැකි විය. එ සේ ම එම පවුලේ දරු දැරියන් රැකියාව වශයෙන් තෝරා ගන්නේ ද එම තේ කර්මාන්තශාලාව ආශ්‍රිත රැකියාවන් ය. නමුත් අද තත්ත්වය එ සේ නොවේ.

8. එ සේ ම නාය යෑම්, ගං වතුර තත්ත්වයන්, ප්‍රමාණවත් වැසි නොමැති වීම යනාදී ස්වභාවික උපද්‍රව හේතුවෙන් ද තේ වගාවන්ට දැඩි හානිකර තත්ත්වයන් ඇති විය හැකි ය. වර්තමානයේ මෙවැනි උපද්‍රවවල වැඩි වීමක් දැක ගත හැකි ය. එ සේ ම උෂ්ණත්වය ඉහළ යෑම වැනි සාධක නිසා ද තේ වගාවට අභියෝගකාරී තත්ත්වයක් ඇති විය හැකි ය.

9. තේ සඳහා අගය එකතු කිරීමේ ක්‍රමවත් වැඩපිළිවෙළක් නොමැති වීම තුළින් අනාගත තේ ඉල්ලුම සඳහා තර්ජනයක් ඇති විය හැකි ය.

10. වෙනස්වන පාරිභෝගික රුචිකත්වය, සෞඛ්‍ය සහ පාරිසරික තත්ත්වයන් යනාදිය තේ කර්මාන්තයට අභියෝගයක් වෙමින් පවතී.■



මහනුවර හන්තානේ පිහිටි ශ්‍රී ලංකා තේ කෞතුකාගාරය







ශ්‍රී ලංකාවේ තේ වගාව ආරම්භ කළ ලූල්කඳුර වතුයාය



# දරිද්‍රතාව (Poverty)

එන්.එම්.එම්. දමයන්ති, ජ්‍යේෂ්ඨ සහකාර අධ්‍යක්ෂ
සී. එස්. ගුණවර්ධන, ජ්‍යේෂ්ඨ සහකාර අධ්‍යක්ෂ
බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව


## 1. හැඳින්වීම

කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩායමකට යහපත් ජීවන තත්ත්වයක් සඳහා අවශ්‍ය වන අවම සුභසාධන තත්ත්වයට ළඟා වීමේ හැකියාව අහිමි වීම දරිද්‍රතාව ලෙස හැඳින්වේ. රොබට් චැම්බර්ස් (Robert Chambers) හඳුන්වා දී ඇති ආකාරයට දරිද්‍රතාවේ පැතිකඩ පහක් ඇත.

(i) ආදායම් දරිද්‍රතාව (Income Poverty)
(ii) කායික දුබලතාව (Physical Poverty)
(iii) පීඩනයන්ට ගොදුරු වීමේ නැඹුරුතාව (Vulnerability)
(iv) බල රහිතභාවය (Powerlessness)
(v) හුදෙකලා වීම (Isolation)

ඉහත සඳහන් කළ දරිද්‍රතාවේ විවිධ අංශ අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙක කෙරෙහි බලපාමින්, දරිද්‍රතාව තවතවත් තීව්‍ර කෙරෙමින්, දිළින්දන් විහීනතා පාශයක (Poverty Deprivation) හසුකොට ගෙන සිටින බව පහත රූප සටහනින් පෙන්නුම් කෙරේ.

ආදායම් හෝ පරිභෝජනය අහිමි වීම පදනම් කර ගෙන නිර්වචනය කරන දරිද්‍රතාව, ආදායම් දරිද්‍රතාව ලෙස හැඳින්වේ. ආදායම් දරිද්‍රතාවේ ප්‍රධාන පැතිකඩ දෙකකි.



(i) සාපේක්ෂ දරිද්‍රතාව (Relative Poverty)
(ii) නිරපේක්ෂ දරිද්‍රතාව (Absolute Poverty)

රටක සිටින ජනගහනයෙන්, එක් කොටසකගේ සමාජ ආර්ථික තත්ත්ව සමඟ සලකා බලන විට, තවත් කොටසකගේ සමාජ ආර්ථික තත්ත්ව සාපේක්ෂ වශයෙන් දිළිඳු වීම "සාපේක්ෂ දරිද්‍රතාවයි". පුද්ගලයෙකුට තම මූලික අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය කරන, අවම ආදායම් මට්ටම නොමැති වීම නැතහොත් යම් ජන කොට්ඨාසයක් අත්‍යවශ්‍ය ම අවම පෝෂණ මට්ටමක් නො ලබා මන්දපෝෂණ තත්ත්වයක සිටී නම් එය "නිරපේක්ෂ දරිද්‍රතාව" ලෙස හැඳින්වේ.

කිසියම් ජන කොටසක් අත්‍යවශ්‍ය අවම පෝෂණ මට්ටමක්වත් නො ලබා මන්දපෝෂණ රෝග පීඩා, ඉහළ ළදරු මරණ, අඩු ආයුෂ උරුම කර ගත් පිරිසක් නම් ඔවුහු නිරපේක්ෂ දරිද්‍රතාවෙන් පෙළෙන්නෝ වෙති.

දිළිඳු ජන සංඛ්‍යා අනුපාත ගණනය කිරීමෙන් නිරපේක්ෂ දරිද්‍රතාව මැන දක්වයි. එබැවින් නිරපේක්ෂ දරිද්‍රතාව සෑම රටකට ම පොදු නො වේ. නමුත් සාපේක්ෂ දරිද්‍රතාව සෑම රටකට ම පොදු වේ.

**1 වන වගුව**
**නිරපේක්ෂ දරිද්‍රතාවේ මෑත කාලීන ප්‍රවණතා**

| වසර | දරිද්‍රතා දර්ශකය (%) |
|---|---|
| 1990/1991 | 26 |
| 1995/1996 | 28.8 |
| 2002 | 22.7 |
| 2006/2007 | 15.2 |
| 2009/2010 | 8.2 |
| 2012/2013 | 6.7 |
| 2016 | 4.1 |

### මානව දරිද්‍රතාව

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මානව දරිද්‍රතාව නිර්වචනය කරනු ලබන්නේ "නිදහස, ආත්ම ගරුත්වය හා අන්‍යයන්ගේ සැලකිල්ල භුක්ති විඳිමින් සෞඛ්‍ය සම්පන්න ව හා සතුටුදායක ජීවන තත්ත්වයක් ගත කිරීමට අදාළ මානව සංවර්ධනය සඳහා ඇති ඉඩප්‍රස්තා සහ තේරීම් අහිමි වී ගිය තත්ත්වයක්"වශයෙනි.

මානව සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය කරුණු තුනක විහීනතාව, එනම් දීර්ඝායුෂ නොමැති වීම, දැනුම නොමැති වීම සහ යහපත් ජීවන තත්ත්වයක් නො ලැබී යාම යන සාධක පදනම් කර ගෙන මානව දරිද්‍රතා දර්ශකය සකස් කරනු ලැබේ.

## 2. ජාතික දරිද්‍රතා රේඛාව හා ජාත්‍යන්තර දරිද්‍රතා ඉම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව 2019 වසරේ පළමු කාර්තුව සඳහා නිල දරිද්‍රතා රේඛාව එක් පුද්ගලයෙකුට රු. 4,730/- කි. මෙයින් අදහස් වන්නේ මාසික ඒක පුද්ගල මුළු මූර්ත පරිභෝජන වියදම රු. 4,730.00ට අඩු පුද්ගලයින් දුප්පතුන් බවයි. මෙම දරිද්‍රතා ආපාතය/ඉම නැතහොත් ශ්‍රී ලංකාවේ නිල දරිද්‍රතා ඉම ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වේ.

(i) ආහාර දරිද්‍රතාව
(ii) ආහාර නො වන දරිද්‍රතාව

### ආහාර දරිද්‍රතාව

ආහාර දරිද්‍රතාවය යනු එක් පුද්ගලයෙකුට; දිනකට කැලරි 2,370ක් බැගින් මාසයකට ලබා ගත යුතු කැලරි සහිත ආහාර ලබා ගැනීමට ඇති නොහැකියාවයි.

### ආහාර නො වන දරිද්‍රතාව

කිසියම් පුද්ගලයෙකුට, ආහාර නො වන අනෙකුත් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා දැරිය යුතු වියදම මත දරිද්‍රතාව මනින විට එය ආහාර නො වන දරිද්‍රතාව ලෙස හඳුන්වයි.

දිනකට එක්සත් ජනපද ඩොලරයකට වඩා අඩු ආදායමකින් අවශ්‍යතා සපුරා ගනු ලබන ජනගහනය දරිද්‍රතාවෙන් පෙළේ යැයි තීරණය කිරීම ජාත්‍යන්තර දරිද්‍රතා ඉම ලෙස හඳුන්වනු ලබයි. ලෝක බැංකුවේ නිර්වචනයන්ට අනුව වරින්වර මෙම මට්ටම් වෙනස් වේ. මේ සඳහා ක්‍රය ශක්ති සාම්‍ය මත ගලපන ලද ඇමරිකානු ඩොලරය පදනම් කර ගනී.

## 3. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව

ආහාර නො වන දරිද්‍රතාව හා ආහාර දරිද්‍රතාව වශයෙන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව මැන දක්වයි. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවෙන් පෙළෙන ජනගහනයෙන් සියයට 90ක් ම ග්‍රාමීය ජනතාව වේ. ආර්ථික හා සමාජීය යටිතල පහසුකම් ඉතා අඩුවෙන් වර්ධනය වී ඇති ප්‍රදේශ ග්‍රාමීය අංශයට අයත් වන අතර වතු අංශය ද මීට

ඇතුළත් ය. එමෙන් ම ශ්‍රී ලංකාවේ ආදායම් දරිද්‍රතාව හා මානව සංවර්ධන දරිද්‍රතාව අතර ඉතා සමීප සම්බන්ධයක් පවතී. ශ්‍රී ලංකාවේ මානව දරිද්‍රතා දර්ශකය සියයට 16.8ක් වේ. දරිද්‍රතාව සලකා බලන කළ දකුණු ආසියාවේ දෙවන ස්ථානයත්, ලෝකයේ 76 වන ස්ථානයත් ලංකාවට හිමි වී ඇත.

දකුණු ආසියානු කලාපයේ රටවල් අතුරින් අඩු ම දරිද්‍රතාවක් ඇත්තේ මාලදිවයිනේ ය. මානව දරිද්‍රතාව වැඩි ම රට වන්නේ ඇෆ්ගනිස්ථානයයි.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය හා වතු අංශවල දරිද්‍රතා රේඛාවට පහළ ජනගහන ප්‍රතිශතය තවමත් ඉතා ඉහළ අගයක් ගැනීමට විවිධ හේතු බලපෑ හැකි යි. ඒ අතර පහත සඳහන් කරුණු වැදගත් වේ.

**2 වන වගුව**
**ආසියාවේ රටවල් කිහිපයක මානව දරිද්‍රතා දර්ශක**

| රට | මානව දරිද්‍රතා දර්ශකය | |
|---|---|---|
| | දර්ශක අගය (%) | හිමි ස්ථානය |
| මාලදිවයින | 16.5 | 66 |
| ශ්‍රී ලංකාව | 16.8 | 76 |
| ඉන්දියාව | 28 | 88 |
| නේපාලය | 31.2 | 99 |
| පකිස්ථානය | 33.4 | 101 |
| බංගලාදේශය | 36.1 | 112 |
| ඇෆ්ගනිස්ථානය | 59.8 | 135 |

- දේශීය කෘෂිකර්මාන්තයේ ඵලදායකත්වය අඩු වීම
- අධ්‍යාපනයෙහි ගුණාත්මක බව අඩු වීම නිසා, ශ්‍රම වෙළෙඳපොළට ගැලපෙන ඵලදායී නිපුණතා වර්ධනය නො වීම
    - භූගෝලීය වශයෙන් හුදකලා වීම
    - සුරාසූදුවලට ඇබ්බැහි වීම
    - වසර ගණනාවක් තිස්සේ යුධ ගැටුම් පැවතීම
    - ආර්ථික වර්ධන ක්‍රියාවලීන් නාගරික ප්‍රදේශවලට සංකේන්ද්‍රණය වීම
    - ආකල්ප
    - රජයේ දිළිඳුකම දුරැලීමේ වැඩසටහන්වල ඇති අකාර්යක්ෂමතාව (ජනසවිය, සමෘද්ධිය)
    - ව්‍යවසායකත්ව වර්ධනයන් මන්දගාමී වීම
    - ඌන සේවා නියුක්තිය හා සැඟවුණු සේවා වියුක්තිය
    - ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැති වීම
    - වතු අංශයේ ශ්‍රම සංචලතාව අඩු වීම
    - දුබල ආදායම් මූලාශ්‍ර පැවතීම

ශ්‍රී ලංකා රජයට, දිළිඳු ජනතාවට හිතකර ආර්ථික වෘද්ධියක් ඇති කරලීම උදෙසා විවිධ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කළ හැකි වේ. එම ක්‍රියාමාර්ග වන්නේ

- පුද්ගලයන්ගේ ඉඩම් අයිතිය තහවුරු කිරීම (උදා: ඉඩම් ප්‍රතිසංස්කරණය)
- දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල සමාජ හා ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
- දුප්පත් ජන කොට්ඨාසවලට ලබා දෙන අධ්‍යාපනයේ ගුණාත්මක බව වර්ධනය කොට මානව ප්‍රාග්ධනය ශක්තිමත් කිරීම
- නව තාක්ෂණය සහ වෙළෙඳපොළ ශක්තිමත් කිරීම තුළින් කෘෂිකාර්මික අංශයට නව ජවයක් ලබා දීම
- කෘෂිකර්මාන්තය පදනම් කර ගත් කර්මාන්ත සංවර්ධනය කිරීම
- රැකියාවක් කළ නො හැකි, ආබාධිත හා වියපත් පුද්ගලයන් රැක බලා ගැනීමට සමාජ ආරක්ෂණ ජාල ඇති කිරීම
- විශේෂයෙන් කර්මාන්ත ක්ෂේත්‍රයේ ආයෝජනය කිරීම සඳහා යෝග්‍ය වාතාවරණය ගොඩ නැංවීම තුළින් ආර්ථික වර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම

## 4. දරිද්‍රතාවට බලපාන හේතු

දරිද්‍රතාවට බලපාන විවිධාකාර හේතු දැකිය හැකි ය.

**ප්‍රාදේශීය ලක්ෂණ** - මේ යටතේ සලකා බැලෙනුයේ ගංවතුර, සුළි සුළං වැනි ස්වභාවික උපද්‍රවවලට නිරන්තරයෙන් ගොදුරු වන ප්‍රදේශයක් ද, භූගෝලීය වශයෙන් හුදෙකලා වූ ප්‍රදේශයක් ද යන වග හෝ රටක පරිපාලනයේ ගුණාත්මක තත්ත්වය, දේපොළ අයිතිය හා ඒවා බලගැන්වීමෙහිලා පවතින නෛතික ව්‍යුහය වැනි කරුණු වේ.

**ප්‍රජාවට ආවේණික ලක්ෂණ** - ප්‍රජාව සඳහා මංමාවත්, ජලය, විදුලිය වැනි මූලික යටිතල පහසුකම් ප්‍රමාණවත් ව සැපයෙනවාද, අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවා සතුටුදායක ව සැපයෙනවා ද, වෙළෙඳපොළට ප්‍රවේශ වීමෙහිලා පවතින පහසුකම් හා සමාජ සම්බන්ධතාවල ස්වරූපය යනාදී කරුණු මේ යටතේ සලකා බැලේ.

**කුටුම්භ හා පුද්ගල කේන්ද්‍රීය ලක්ෂණ** - මේ යටතේ ප්‍රජා විද්‍යාත්මක ලක්ෂණ වශයෙන් කුටුම්භයේ විශාලත්වය, වයස් ව්‍යුහය, යැපුම් අනුපාතය, ගෘහමූලිකයාගේ ස්ත්‍රී/පුරුෂ භාවය යන කරුණු ප්‍රධාන තැනක් ගනී. ආර්ථික ලක්ෂණ ලෙස සේවා නියුක්ති තත්ත්වය, වැඩ කරන පැය ගණන, දේපොළ හිමිකාරිත්වයේ ස්වභාවය යනාදී කරුණු සලකා බැලේ. සමාජීය ලක්ෂණ ලෙස සෞඛ්‍ය හා පෝෂණ මට්ටම, අධ්‍යාපන සේවාව හා වාසස්ථානවල තත්ත්වය වැනි කරුණු සලකා බැලේ.

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව කෙරෙහි ආංශීය හා ස්ථානීය කරුණු ද බලපායි. ආංශික ලක්ෂණ යටතට කෘෂිකාර්මික ගැටලු (ඉඩම් හිඟය, ඵලදායීත්වය අඩු වීම, ආදායම් හිඟය), අධ්‍යාපනික ගැටලු (අධ්‍යාපනය ලැබීමට ඇති අඩු පහසුකම් සහ ප්‍රාදේශීය විෂමතා) හා බලශක්ති පිළිබඳ ගැටලු (ඛණිජ තෙල් මිල ඉහළ යෑම, විකල්ප බලශක්ති නොමැති වීම) අදාළ වේ.

## 5. ආර්ථික වෘද්ධිය හා දරිද්‍රතාව

ආර්ථික වෘද්ධියත් සමඟ වෘද්ධි ක්‍රියාවලියට පුද්ගලයන් සම්බන්ධ වේ. එනම් පුද්ගලයන්ට රැකියා අවස්ථා ලැබේ. ඒ තුළින් ආදායම් වැඩි වී, භාණ්ඩ හා සේවා ප්‍රමාණයක් පරිභෝජනය කිරීමට අවස්ථාව ලැබීමෙන් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් වීම තුළින් දරිද්‍රතාව තුරන් වේ.

නමුත් ආර්ථික වෘද්ධියකින් පමණක් දරිද්‍රතාව තුරන් වේ යැයි අපට නිගමනය කළ නො හැකි ය. ප්‍රායෝගික ව බලන කළ ආර්ථික වෘද්ධිය හා දරිද්‍රතාව අඩු වීම අතර ඍජු සම්බන්ධතාවක් නොමැත. එ නම් ආර්ථික වෘද්ධි රටාව, වෘද්ධිය බිහි කරන මූලාශ්‍ර හා වෘද්ධියේ ප්‍රතිලාභ බෙදී යෑම වැනි සාධක ද දරිද්‍රතාව අවම කිරීමට බලපායි.

ආර්ථිකය තුළ පවතින දුර්වල අංශ හඳුනා ගෙන ඒවායේ ඵලදායිතාව සහ සේවා නියුක්තිය වැඩි කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සැකසීම ඉතා වැදගත් වේ. දිළිඳු ජනතාව සතු ප්‍රධාන වත්කම වන ශ්‍රමය ඵලදායී ලෙස උපයෝජනය කළ හැකි වන පරිදි වෘද්ධි උපායන් අනුගමනය කිරීමෙන් දිළිඳුකම හා ආදායම් විෂමතාව අවම කළ හැකි වේ.

දිළිඳුකම නැතහොත් දරිද්‍රතාව අවම කිරීම සඳහා ක්‍රියා කරන ආර්ථික යාන්ත්‍රණ දෙකක් ඇත.

**වෘද්ධි යාන්ත්‍රණය** - ආර්ථික වර්ධනය ඇති කිරීම මගින් භාණ්ඩ හා සේවා බහුල වීමත්, ඒ තුළින් ආර්ථිකයේ අඩු ආදායම් ලාභීන්ට පරිභෝජන හැකියාවන් ඉහළ නංවා ගැනීමට ඇති හැකියාව වර්ධනය වීමත් සිදු වන අතර එය දරිද්‍රතාව අවම මට්ටමකට පැමිණීමට හේතු වේ.

**ව්‍යාප්ති යාන්ත්‍රණය** - එ නම් අඩු ආදායම් ලාභීන්ට/දිළිඳු පවුල්වලට කෙසේ ආර්ථික වර්ධන අවස්ථාවන් කෙරෙහි ළඟා විය හැකි ද යන්නයි. පරිභෝජන භාණ්ඩ හා සේවාවලින් ආරම්භ වී අනෙකුත් අවශ්‍යතාවන් සපුරා ගැනීමට ආර්ථිකයේ සම්පත් කෙසේ ව්‍යාප්ත වී ඇත් ද යන්න මින් අදහස් වේ.

රටක ආර්ථික වෘද්ධියක් ඇති වූ පමණින් ම දරිද්‍රතාව තුරන් වේ යැයි නිගමනය කළ නො හැකි අතර ඒ සඳහා වෘද්ධි යාන්ත්‍රණය හා ව්‍යාප්ති යාන්ත්‍රණය ක්‍රියාත්මක වන ආකාරයත්, එය තුළින් දරිද්‍රතාව අවම කිරීමට කොපමණ දායක වනවා ද යන්නත් විශේෂයෙන් බලපායි. රටවල් අනුගමනය කරන ආර්ථික ප්‍රතිපත්ති මත මේ සෑම කටයුත්තක් ම තීරණය වේ.

ආර්ථික වෘද්ධියට අමතර ව දිළිඳුකම පිටු දැකීමට, ප්‍රතිපත්ති සමූහයක් ප්‍රධාන කාණ්ඩ තුනක් යටතේ පෙන්වා දිය හැකි ය.

**(i) දිළිඳු ජනතාවට ආර්ථික වෘද්ධි ක්‍රියාවලියට සම්බන්ධ වීමට අවස්ථාව සලසා දීම**

- පෞද්ගලික ආයෝජන ධෛර්යමත් කිරීමට යෝග්‍ය ප්‍රතිපත්ති සකසා දීම
- ජාත්‍යන්තර වෙළෙඳපොළවල් සඳහා ආර්ථිකය විවෘත කිරීමෙන් දිළිඳු ජනතාවට හිමි වන අවස්ථා වැඩි කිරීම
- දිළිඳු ජනතාවට මානව, භෞතික, ස්වාභාවික හා මූල්‍ය වත්කම් හිමි කර ගැනීමට හා භාවිත කිරීමට හැකියාව ලබා දීම
- ස්ත්‍රී පුරුෂ භාවය මත හෝ ජනවර්ග අනුව හෝ ගෝත්‍ර වශයෙන් හෝ සමාජීය වශයෙන් පවතින විෂමතා ඉවත් කිරීම

- දිළිඳු ප්‍රදේශවලට යටිතල පහසුකම් හා තාක්ෂණය ලබා දීම

**(ii) ආර්ථික වර්ධනයත් සමඟ දරිද්‍රතාව අඩු වන ආකාරයෙන් ජනතාව දැනුම්වත් කිරීම හා පරිපාලන ව්‍යුහය ශක්තිමත් කිරීම**

- ජනමාධ්‍ය ශක්තිමත් කිරීම තුළින් තොරතුරු ලබා ගැනීමට ඇති හැකියාව පුළුල් කිරීම
- දිළිඳු ජනතාවට නීති ආධාර සැපයීම තුළින්, නෛතික පද්ධති කරා පහසුවෙන් ප්‍රවේශ වීමට අවස්ථාව ලබා දීම
- රාජ්‍ය පරිපාලනයේ කාර්යක්ෂමතාව අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය කරන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම

**(iii) දරිද්‍රතාව අවම කිරීමට බාධා ඇති විය හැකි විවිධ අවදානම් අවම කිරීමට පියවර ගැනීම**

- ක්ෂුද්‍ර රක්ෂණ ක්‍රම, සංක්‍රාම ගෙවීම, ආණ්ඩුවේ පොදු වැඩ සඳහා සහභාගී කරවා ගැනීම වැනි ක්‍රියාමාර්ග තුළින් අවදානම යම් තාක් දුරකට අඩු කර ගත හැකි වේ.
- ස්වභාවික උපද්‍රව සහ මූල්‍ය අර්බුද වැනි කම්පනයන්ට සාර්ථක ව මුහුණ දීමට හැකි වන සේ ජාතික මට්ටමේ වැඩ සටහන් සැකසීම
- සිවිල් අරගල හා වාර්ගික ගැටුම් සමනය කිරීම සඳහා වැඩ සටහන් සැකසීම
- මැලේරියාව, ක්ෂය රෝගය, ඩෙංගු වැනි රෝග පැතිර යාමේ සෞඛ්‍ය ප්‍රශ්න විසඳීමට ක්‍රියාමාර්ග ගැනීම

ඒ අනුව රටේ ආර්ථික වර්ධනය ළඟා කර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ හැකි වේ.

- දිළිඳු ජනතාවට අයත් මානව හා භෞතික සම්පත් සංවර්ධනය කිරීම
- විශේෂයෙන් මුදල් වෙළෙඳපොළ, ශ්‍රම වෙළෙඳපොළ සහ ඉඩම් වෙළෙඳපොළ දිළිඳු ජනතාවට හිතකර වන ලෙස ක්‍රියාත්මක වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සම්පාදනය කිරීම
- දිළිඳු ජනතාවට අවාසිදායක වන අන්දමින් ක්‍රියාත්මක වන ආණ්ඩුවේ වියදම් ප්‍රතිපත්ති, බදු ප්‍රතිපත්ති, වෙළෙඳ ප්‍රතිපත්ති හා නියාමනයන් ඉවත් කිරීම
- කෘෂිකර්මය හා ග්‍රාමීය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.
- කෘෂිකාර්මික නො වන ආදායම් ඉහළ නැංවීම සඳහා සූක්ෂ්ම හා සුළු කර්මාන්ත නිෂ්පාදකයන්ට අවශ්‍ය තාක්ෂණයට ඇති ප්‍රවේශය පුළුල් කිරීම
- කුඩා පරිමාණ නිෂ්පාදකයන්ට අවදානම් දැරීමට ඇති හැකියාව ඉහළ නැංවීම
- කෙටිකාලීන ව අර්ථවත් ආරක්ෂණ ජාලයන් ලබා දීම. ■

# විදේශ සංචිත සහ විනිමය අනුපාතික කළමනාකරණය



**එරන්දි ලියනගේ**
**ජ්‍යේෂ්ඨ අර්ථශාස්ත්‍රඥ**
**ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව**

මුදල් වශයෙන් හෝ වෙනත් වත්කම් වශයෙන් මහ බැංකු හෝ අනෙකුත් මුදල් අධිකාරීන් සතු ව පවතින විදේශ සංචිත ආර්ථිකයක විදේශීය අංශයේ ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා ඉතා වැදගත් වේ. අනපේක්ෂිත ව ඇති විය හැකි බාහිර අසමතුලිතතාවන්ට මුහුණ දීම සඳහා විශේෂයෙන් ම නැගී එන ආර්ථිකයන් පසුගිය දශක කිහිපයේ විශාල ලෙස විදේශ සංචිත පවත්වා ගත් අතර, විදේශ සංචිත කළමනාකරණය යනු බොහෝ මහ බැංකු මුහුණ දෙන අභියෝගයකි. විදේශ සංචිතවල වැදගත්කම, විදේශ සංචිත පවත්වා ගැනීමේ අරමුණු, විදේශ සංචිත සංයුතිය, සංචිත කළමනාකරණය මෙන් ම විනිමය අනුපාතික විචලනය පිළිබඳ ව විමසා බැලීම මෙම ලිපියේ අරමුණ වේ.

## 1. විදේශ සංචිත[1] හා එහි වැදගත්කම

සිය මුදල් ප්‍රතිපත්ති කාර්යභාරයේ එක් වැදගත් අංගයක් වන විදේශ විනිමය වෙළෙඳපොළ කටයුතුවල දී ද්‍රවශීලතාව තහවුරු කිරීම සඳහා බොහෝ මහ බැංකු විසින් විදේශ සංචිත පවත්වා ගෙන යයි. ස්ථාවර විනිමය අනුපාතිකයක් පවත්වා ගෙන යනු ලබන රටවල් යම් නිශ්චිත විනිමය අනුපාතිකයක් පවත්වා ගැනීම සඳහා විදේශ සංචිත යොදා ගනු ලබයි. එ සේ ම, පාවෙන විනිමය අනුපාතික ප්‍රතිපත්තිය අනුගමනය කරන රටවල් දැඩි ලෙස විදේශ විනිමය වෙළෙඳපොළ විචලනය වන අවස්ථාවල දී ආයෝජක විශ්වාසය ආරක්ෂා කර ගැනීම සඳහා වෙළෙඳපොළේ ද්‍රවශීලතාව සපුරාලීමට බොහෝ විට විදේශ සංචිත භාවිත කරයි. තව ද, බොහෝ රටවල් තම දේශීය ද්‍රවශීලතා මෙහෙයුම් කටයුතු ඉහළ නංවා ගැනීම සඳහා විදේශ සංචිත භාවිත කරන අතර, සමහරක් රටවල් රජයේ ගනුදෙනු හරහා සිදු විය හැකි බලපෑම් කළමනාකරණය කිරීම සඳහා භාවිත කරයි. මෙම එක් එක් ප්‍රතිපත්ති අරමුණුවල ස්වභාවය සලකා බැලීමේ දී මහ බැංකු විසින් විදේශ සංචිත ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීමේ වැදගත්කම පෙන්නුම් කරයි.

## 2. විදේශ සංචිත පවත්වා ගැනීමේ අරමුණු

ලෝකය පුරා සියලු ම රටවල් පාහේ විදේශ සංචිත පවත්වා ගෙන යනු ලබන අතර සමහර විට සංචිත පවත්වා ගෙන යෑමේ අරමුණු රටකින් රටකට වෙනස් විය හැකි ය. ගනුදෙනු චේතනාව, ආරක්ෂණ චේතනාව හා සමපේක්ෂණ චේතනාව මත මුදල් සඳහා පවතින ඉල්ලුම සිදු වන බව සාම්ප්‍රදායික ලෙස හඳුනා ගෙන ඇති අතර, මහ බැංකුවක් විසින් විදේශ සංචිත පවත්වා ගැනීමේ තවත් අරමුණු ද පවතී.

### 2.1 ගෙවුම් තුලනය මූල්‍යනය කිරීමේ අවශ්‍යතාව

ජංගම ගිණුමේ හිඟයක් පවතින විට එය මූල්‍ය ගිණුමෙන් මූල්‍යනය කිරීමට ලෝකයේ අනෙකුත් රටවල්වලින් ණය ලබා ගැනීමට හෝ බැංකු අංශය සතු විදේශීය සංචිත හෝ මූල්‍ය අධිකාරිය සතු දළ නිල සංචිත හෝ භාවිත කිරීමට සිදුවේ. එ සේ ම කිසියම් රටක ජංගම ගිණුමේ අතිරික්තයක් පවතින විට එම අතිරික්තය ලෝකයේ අනෙකුත් රටවලට ණය ලබා දීමට භාවිත කළ හැකි අතර එ සේ භාවිත නො කරන අවස්ථාවල දී බැංකු අංශයේ විදේශීය සංචිත හෝ මූල්‍ය අධිකාරිය සතු දළ නිල සංචිත මට්ටම වැඩි කර ගැනීමට එමගින් හැකියාව ලැබේ.

---

1 ගෙවුම් තුලන අත්පොතේ හයවන සංස්කරණයට අනුව රටක විදේශ සංචිත යනු ගෙවුම් තුලන මූල්‍යන අවශ්‍යතා සඳහා, විනිමය අනුපාතිකයට බලපෑම් කිරීමට විනිමය වෙළෙඳපොළට මැදිහත් වීම සඳහා සහ අනෙකුත් විවිධ අරමුණු (මුදල් හා ආර්ථිකය පිළිබඳ ව විශ්වාසය පවත්වා ගෙන යෑම හා විදේශ ණය ලබා ගැනීමේ පදනම ලෙස කටයුතු කිරීම වැනි) සඳහා මුදල් අධිකාරීන් සතු ව පවතින ගෙවුම් ශේෂ අර්බුදයක දී භාවිත කළ හැකි විදේශීය වත්කම් වේ.

### 2.2 විදේශ විනිමය වෙළෙඳපොළට මැදිහත් වීමේ අවශ්‍යතාව

බොහෝ රටවල් විදේශ විනිමය වෙළෙඳපොළ වෙත මැදිහත් වීම සඳහා විදේශ සංචිත පවත්වා ගනු ලබන අතර, ආරක්ෂණ චේතනාව හේතුවෙන් මෙය මුදලට ඇති ඉල්ලුමට සමාන කළ හැකි ය. ප්‍රාග්ධන විචලනයන් හේතුවෙන් කෙටිකාලීන විනිමය අනුපාතික වෙනස්වීම් නිවැරදි කිරීම සඳහා දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ වෙත මැදිහත් වීම සිදු වේ. එහි දී දේශීය මුදලේ අගය අවප්‍රමාණය වේ නම් විදේශ විනිමය වෙළෙඳපොළට විදේශ විනිමය නිකුත් කරන අතර, දේශීය මුදල අනවශ්‍ය ලෙස අධිප්‍රමාණය වේ නම් විදේශ මුදල් මහ බැංකුව වෙතට ලබා ගැනීමට කටයුතු කෙරෙයි.

ඊට අමතර ව, මැදිකාලීන සාර්ව ආර්ථික ස්ථායිකරණ ප්‍රතිපත්ති අරමුණු කොට ගනිමින් ද මහ බැංකු විනිමය වෙළෙඳපොළ වෙත මැදිහත් වීම කරයි. විශේෂයෙන් ම වඩාත් දියුණු මට්ටමක නො පවතින මූල්‍ය වෙළෙඳපොළක් පවතින රටවල් විදේශ විනිමය වෙළෙඳපොළ වෙත මැදිහත් වීමෙන් පොලී අනුපාතික සහ විනිමය අනුපාතික මත වන පීඩනය අඩු කිරීමට කටයුතු කරයි.

### 2.3 විදේශ විනිමය අනුපාතිකය කෙරෙහි ඇති විශ්වාසය පවත්වා ගැනීමේ අවශ්‍යතාව

සමාන ආනයනික මාස ගණන වැනි දර්ශක මගින් රටක සංචිත අගයෙහි ප්‍රමාණාත්මකභාවය පිළිබිඹු කෙරෙන අතර එමගින් යම් රටක ආර්ථිකය පිළිබඳ ව අදහසක් ලබා ගැනීමට උපකාරී වේ. විදේශීය ණය ලබා ගැනීමේ දී, විදේශ ආයෝජනවල දී (සෘජු ආයෝජන, කළඹ ආයෝජන) රටේ ණය ශ්‍රේණිගත කිරීමේ දර්ශකය ඉතා වැදගත් වන අතර එහි දී සංචිත ප්‍රමාණාත්මකභාවය ප්‍රධාන සාධකයක් වේ. එම නිසා, රටක විදේශීය අංශයේ ස්ථාවරභාවය පුළුල් ලෙස පිළිබිඹු කෙරෙන දර්ශකයක් ලෙස සංචිත වැදගත් වේ.

## 3. විදේශ සංචිත සංයුතිය

1970 මුල් කාලයේ දී බ්‍රෙට්න්වුඩ්ස් ක්‍රමය අවසන් වීමත් සමඟ පාවෙන විනිමය අනුපාතික ප්‍රතිපත්තිය වෙත යොමු වූ රටවලට විදේශ සංචිත පවත්වා ගැනීමේ අවශ්‍යතාව යම්තාක් දුරකට අඩු වනු ඇතැයි අපේක්ෂා කරන ලදී. කෙසේ වුව ද, එ සේ අපේක්ෂා කළ පරිදි විදේශ සංචිත සඳහා වූ ඉල්ලුම අඩු නො වූ අතර, ඒ සඳහා හේතු කිහිපයක් දැක්විය හැකි ය. එයට එක් හේතුවක් වූයේ පාවෙන විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් වෙත රටවල් යොමු වුව ද එය වඩාත් නම්‍යශීලී නො වූ අතර, විශාල ලෙස විනිමය අනුපාතික කළමනාකරණය කිරීමට එම රටවල් මැදිහත් වීමයි. තව ද, බ්‍රෙට්න්වුඩ්ස් ක්‍රමය අහෝසි වීමෙන් පසු බොහෝ කාර්මික රටවල් විනිමය අනුපාතික වෙනස්වීම්වලට සාර්ථක ව මුහුණ දුන්න ද නාමික විනිමය අනුපාතික කෙටිකාලීන ව විචලනය වීම සහ ඉහළ යෑම නිසා කෙටිකාලීන විනිමය අනුපාතික කළමනාකරණය කිරීමට සංචිත සඳහා වූ ඉල්ලුම ඉහළ ගියේ ය.

කිසියම් රටක විදේශ සංචිත පවත්වා ගත යුතු ප්‍රශස්ත මට්ටම තීරණය කිරීම ඉතා සංකීර්ණ වේ. ප්‍රශස්ත මට්ටම ගණනය කිරීම සඳහා කලින් කලට නොයෙකුත් දර්ශක උපයෝගී කර ගත් අතර, මුදල් පදනම් කර ගත් වෙළෙඳාම ආශ්‍රිත දර්ශක ඒ අතර විය. මෑතකාලීන ව විදේශ සංචිත ප්‍රශස්ත මට්ටම ගණනය කිරීම සඳහා කෙටිකාලීන විදේශීය ණයවල ප්‍රතිශතයක් ලෙස, පුළුල් මුදල් සැපයුමෙහි ප්‍රතිශතයක් ලෙස, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සංචිත කොපමණ ද මෙන් ම සංචිත ආනයනික මාස කීයක් සඳහා ප්‍රමාණවත් වේ ද ආදී දර්ශක යොදා ගනු ලබයි. ප්‍රාග්ධන ගිණුමේ වෙනස්වීම් හේතුවෙන් ආර්ථිකයක ඇති විය හැකි අවදානම අඩු කිරීම සඳහා සංචිත ප්‍රමාණවත් පරිදි පවත්වා ගැනීම අරබයා කෙටිකාලීන විදේශ ණයවල ප්‍රතිශතයක් ලෙස හා පුළුල් මුදල් සැපයුමෙහි ප්‍රතිශතයක් ලෙස විදේශ සංචිත ගණනය කරනු ලබයි. එ සේ ම, අර්බුද කාල පරිච්ඡේදවල දී දේශීය හා විදේශීය මූල්‍ය වත්කම් අඩු වීම තුළින් විදේශ සංචිත ප්‍රමාණාත්මකතාව ගණනය කිරීම කෙරෙහි බලපෑම් ඇති විය හැකි ය. එම නිසා විශේෂයෙන් ම නැගී එන ආර්ථිකයන්හි විදේශීය සංචිත ප්‍රමාණාත්මකභාවය ගණනය කිරීමට මෙලෙස විවිධ දර්ශක යොදා ගනු ලැබේ.

## 4. විදේශ සංචිත කළමනාකරණය

අරමුණු අනුව විදේශ සංචිත කළමනාකරණය සඳහා විවිධ කළමනාකරණ ප්‍රවේශ පවතින අතර විදේශ සංචිත භාවිත කරමින් සිදු කෙරෙන ආයෝජන විධි ප්‍රධාන වශයෙන් ක්‍රම දෙකකට බෙදා දැක්විය හැකි ය.

**අක්‍රීය කළමනාකරණය:** විදේශ විනිමය වත්කම් මිලදී ගැනීම සහ එය කල් පිරෙන තෙක් පවත්වාගෙන යෑම

සඳහා පමණක් අක්‍රීය කළමනාකරණ ක්‍රමෝපාය සීමා වන අතර මෙහි දී කළමනාකරුවන් වෙත ඉතා සීමිත වගකීමක් පැවරේ.

**සක්‍රීය කළමනාකරණය:** සක්‍රීය කළමනාකරණ රාමුවක් මගින් කළමනාකරුවන්ට වෙළෙඳපොළ සංවර්ධනයන් තුළින් වන අපේක්ෂා පදනම් කර ගනිමින් සංචිත වෙනස් කිරීමට හැකියාව ලැබේ. මෙහි දී කළමනාකරුවන්ට කෙටි කාලීන වෙළෙඳපොළ විෂමතා හඳුනා ගැනීමට හැකියාව පවතින බවටත් දිගු කාලීන ආර්ථික සංවර්ධන ප්‍රවණතා හඳුනා ගැනීම හරහා සාපේක්ෂ වාසි ලබා ගැනීමේ හැකියාව පවතින බවටත් උපකල්පනය කෙරේ.

මෙම ක්‍රම දෙක මගින් ම වෙනස් අයුරින් වාසි සැලසෙන අතර මහ බැංකුවල අරමුණු සහ අවදානම්වලට මුහුණදීමේ හැකියාව අනුව වඩාත් සුදුසු ක්‍රමය තීරණය කර ගත යුතු වේ.

## 5. ශ්‍රී ලංකාවේ විදේශ සංචිත කළමනාකරණය

ශ්‍රී ලංකාවේ විදේශ සංචිත කළමනාකරණය රජය වෙනුවෙන් සිදු කරනු ලබන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසිනි. මුදල් නීති පනතට අනුව ශ්‍රී ලංකා රුපියලේ අගයේ ස්ථායිතාව පවත්වා ගැනීමටත්, ජාත්‍යන්තර ජංගම ගනුදෙනු නිදහසේ සිදු කිරීමටත් සහතික වෙමින් ප්‍රමාණවත් ලෙස විදේශ සංචිත පවත්වා ගෙන යා යුතු ය. යම් අවස්ථාවක දී විදේශ සංචිත සැලකිය යුතු පහළ යැමකට හේතු වෙමින් ගෙවුම් තුලනයෙහි හිඟයක් ඇතිවේ යැයි මුදල් මණ්ඩලය අපේක්ෂා කළහොත් හෝ රුපියලේ අගය කෙරෙහි අහිතකර ලෙස බලපාමින් විදේශ සංචිත අඩු වේ යැයි සැලකුවහොත් හෝ මුදල් මණ්ඩලය විසින් එය මැඩ පැවැත්වීම සඳහා විචක්ෂණශීලී ක්‍රියාමාර්ග ගත යුතු වේ. එ සේ ම එම නිසා ශ්‍රී ලංකා රුපියල මත වන බලපෑම පිළිබඳ ව හා මුදල් මණ්ඩලය විසින් මෙවැනි තත්ත්වයක දී ගනු ලැබූ ක්‍රියාමාර්ග මෙන් ම රජය විසින් ගත යුතු ක්‍රියාමාර්ග ද යෝජනා කරමින් මුදල් අමාත්‍යවරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

මුල් කාලයේ දී විදේශ සංචිත කළමනාකරණය ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු කටයුතු දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබුණ අතර 2002 වසරේ දී බැංකු කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යයන් සඳහා නව දෙපාර්තමේන්තු හතරක් ස්ථාපනය කරමින් එම දෙපාර්තමේන්තු වෙත පවරන ලදී. සාර්ථක සංචිත කළමනාකරණය සඳහා නිවැරදි හා යෝග්‍ය ප්‍රතිපත්ති රාමුවක පවතින අවශ්‍යතාව හඳුනා ගනිමින් විදේශ සංචිත කළමනාකරණය කිරීම එ සේ ස්ථාපිත කරන ලද ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත පවරන ලදී. එ සේ ම, මුදල් ප්‍රතිපත්ති කටයුතු හා සංචිත කළමනාකරණ කටයුතු සඳහා සහාය වීමට විදේශ සංචිත කළමනාකරණ කමිටුව සහ වෙළෙඳපොළ මෙහෙයුම් කටයුතු කමිටුව යන කමිටු පිහිටුවන ලදී.

## 6. ශ්‍රී ලංකාවේ විදේශ සංචිත ප්‍රවණතා

1948 වසරේ දී ශ්‍රී ලංකාව නිදහස ලබන විට විදේශ සංචිත යම් ප්‍රශස්ත මට්ටමක පවත්වා ගනු ලැබූව ද පසු ව ක්‍රමයෙන් අඩු විය. ශ්‍රී ලංකා ආර්ථිකය යම් යම් කාල පරිච්ඡේදවල දී අපනයන ඉහළ යැම හරහා වාසි ලැබූව ද අපනයන අංශය විවිධ බලපෑම්වලට ලක් විය. එ සේ ම විශේෂයෙන් ම 1973-74, 1981 හා 2007-2008 කාලවල දී ඛනිජ තෙල් මිල ගණන් ඉහළ යැමෙන් ආනයන වියදම ඉහළ යැම සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස වෙළෙඳ හිඟය පුළුල් වීමෙන් දළ නිල සංචිතවල පහළ යැමක් සිදු විය. ශ්‍රී ලංකාව නිදහස ලැබීමෙන් පසු අවධියේ විදේශීය අංශය හා සම්බන්ධ දර්ශක කිහිපයක් 1 වන වගුව මගින් පෙන්නුම් කරයි.

1950 වර්ෂයේ දී දළ නිල සංචිත එක්සත් ජනපද ඩොලර් මිලියන 190ක් ලෙස ආනයන මාස 9.3ක ප්‍රමාණවත් පරිදි ඉහළ මට්ටමක පැවතුණි. 1960 දශකයේ දී ක්‍රමයෙන් අඩු වූ සංචිත 1969 වසරේ දී මෙතෙක් වාර්තා වූ අඩු ම අගය වන එක්සත් ජනපද ඩොලර් මිලියන 40 දක්වා පහළ ගිය අතර එයට ප්‍රධාන හේතුවක් ලෙස ආනයන සැලකිය යුතු ලෙස ඉහළ යැම දැක්විය හැකි ය. විදේශ සංචිතවල ප්‍රමාණාත්මකභාවය සැලකීමේ දී 1975 වර්ෂයේ දී ආනයන මාස 0.9කට සමාන වන පරිදි විදේශ සංචිත තියුණු ලෙස පහළ ගියේ ය. කෙසේ වුව ද, 1977 වසරේ දී හඳුන්වා දුන් ආර්ථික ප්‍රතිසංස්කරණ මෙන් ම ජංගම ගිණුම හා සම්බන්ධ ව විනිමය පාලන රෙගුලාසි ලිහිල් වීම සමග රටේ සංචිත මට්ටම සැලකිය යුතු ලෙස පුළුල් වූ අතර 1978 වසරේ දී සංචිත ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් බිලියනය ඉක්මවී ය. විදේශ සේවා නියුක්තිකයන්ගේ සංක්‍රාම සහ පෞද්ගලික ප්‍රාග්ධන ලැබීම් ද විදේශ සංචිත ඉහළ යැම සඳහා චක්‍රාකාරයෙන් දායක විය.

කෙසේ වුව ද, ඉන්ධන මිල ගණන් ඉහළ යැම මෙන් ම අහිතකර කාලගුණික තත්ත්වය හේතුවෙන් තාප විදුලි

**1 වන වගුව**


**විදේශීය අංශය හා සම්බන්ධ දර්ශක (1950 - 2018)**

කාල පරිච්ඡේදයේ සාමාන්‍යය

| දර්ශකය | 1951-1960 | 1961-1970 | 1971-1980 | 1981-1990 | 1991-2000 | 2001-2010 | 2011-2018 |
|---|---|---|---|---|---|---|---|
| අපනයන වර්ධනය (%) | 3.3 | -0.9 | 13.0 | 7.4 | 11.1 | 5.1 | 4.5 |
| ආනයන වර්ධනය (%) | 6.1 | -0.5 | 20.6 | 3.0 | 10.8 | 7.9 | 7.6 |
| ජංගම ගිණුමේ ශේෂය (ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස) | -1.0 | -2.7 | -3.4 | -6.6 | -5.0 | -3.1 | -3.6 |
| විදේශීය ණය සේවාකරණ අනුපාතය භාණ්ඩ හා සේවා අපනයන ආදායමේ ප්‍රතිශතයක් ලෙස | 1.7 | 6.7 | 18.5 | 22.0 | 15.1 | 14.0 | 23.5 |
| දළ නිල සංචිත (එ.ජ. ඩොලර් මිලියන) | 170.5 | 64.9 | 185.7 | 365.9 | 1,605.3 | 3,175.8 | 7,219.9 |
| ආනයන මාස ගණන | 7.0 | 2.5 | 3.6 | 3.5 | 5.7 | 5.5 | 5.5 |
| විනිමය අනුපාතිකය (එ.ජ. ඩොලරයට රුපියල්) | 4.76 | 5.13 | 9.70 | 28.16 | 55.91 | 103.41 | 136.80 |

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

**1 වන රූප සටහන - දළ නිල විදේශ සංචිත**




මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

බලය මත ඉහළ රැඳියාවක් පැවතීමෙන් ඉන්ධන පරිමාව ඉහළ යෑමෙන් සිදු වූ ආනයන වියදම ඉහළ යෑම් ද හේතු කොට ගෙන 2000 වසරේ දී දළ නිල සංචිත ඊට පෙර වසරේ පැවති එක්සත් ජනපද ඩොලර් 1,639ක සිට එක්සත් ජනපද ඩොලර් 1,049 ක් දක්වා පහළ ගියේ ය. 2004 වසරේ ඇතිවූ සුනාමි ව්‍යසනයෙන් පසු ව ලද විදේශීය ප්‍රදාන සහ ආධාර හේතුවෙන් විදේශ සංචිත සැලකිය යුතු ලෙස ඉහළ ගිය ද 2008 වසරේ දී ගෝලීය මූල්‍ය අර්බුදය හේතුවෙන් දළ නිල සංචිත ඊට පෙර වසරේ පැවති එක්සත් ජනපද ඩොලර් මිලියන 3,508 සිට එක්සත් ජනපද ඩොලර් මිලියන 2,561ක් දක්වා පහළ ගියේ ය. එමගින් 2008 වසර අවසානය වන විට දළ නිල සංචිත ආනයන මාස 2.0කට පමණක් සමාන විය. කෙටිකාලීන විදේශ ආයෝජන ආපසු සිය රටවල් වෙත රැගෙන යෑම, අපනයන පහළ යෑම, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අඩු වීම, ප්‍රාග්ධන ලැබීම අඩු වීම මෙන් ම ආනයන ඉහළ යෑම හේතුවෙන් විනිමය අනුපාතික මත ඇති වූ පීඩනයට පිළියමක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විදේශ විනිමය වෙළෙඳපොළ වෙත මැදිහත් විය.

2009 වසරෙන් පසුව සියුම් උච්ඡාවචනයන්ට ලක්වූ දළ නිල සංචිත 2017 වසර අවසානය වන විට එක්සත්

ජනපද ඩොලර් බිලියන 8කට ආසන්න වූ අතර 2018 අප්‍රේල් මස අවසානයේ දී මෙතෙක් වාර්තා කළ ඉහළ ම අගය වන එක්සත් ජනපද ඩොලර් බිලියන 9.9ක් වාර්තා කළේ ය. කෙසේ වුවද, 2018 වසර තුළ දී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම් තුළින් වූ ලැබීම්, හම්බන්තොට වරාය වෙත ලැබුණු ආයෝජන සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වාරික ලැබීම් හේතුවෙන් සංචිත ඉහළ ගිය ද පොලී සහ ණය වාරික ගෙවීම් ඇතුළත් විදේශ ව්‍යාපෘති ණය ආපසු ගෙවීම් සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා වූ පොලී ගෙවීම්, විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකමට අදාළ ණය වාරික ගෙවීම්, ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම් පියවීම් සහ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ වෙත විදේශ විනිමය සැපයීම යනාදී මූලික ගෙවීම් හේතුවෙන් 2018 වසර අවසානය වන විට දළ නිල සංචිත ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් බිලියන 6.9 දක්වා පහළ ගියේ ය.

## 7. ශ්‍රී ලංකාවේ විදේශ සංචිත සංයුතිය

මුදල් නීති පනතේ 67 වගන්තිය යටතේ මහ බැංකුවට රත්‍රන් හෝ ජාත්‍යන්තර අරමුදල් හුවමාරුව සඳහා භාවිත කරන මූල්‍ය ලේඛන හා උපකරණ, විදේශීය මහ බැංකු, භාණ්ඩාගාර සහ වාණිජ බැංකු වෙත පවතින ඉල්ලුම් හා කාලීන තැන්පතු, විදේශීය රජයන්ගේ සුරැකුම්පත්, විදේශීය කාසි හා නෝට්ටු ලෙස පවතින වත්කම් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පවතින විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) ලෙස විදේශ සංචිත පවත්වා ගෙන යා හැකි ය.


2018 වසර අවසානය වන විට ශ්‍රී ලංකාවේ විදේශ සංයුතිය රූප සටහන 2 මගින් දක්වා ඇත.

කෙසේ වුව ද, ශ්‍රී ලංකාව විදේශ සංචිත කළමනාකරණයේ දී විවිධ අභියෝගවලට මුහුණ දෙයි. විශේෂයෙන් ම රජය ලබා ගෙන ඇති ණයවලින් සියයට 40-45 පමණ ප්‍රමාණයක් විදේශ රටවලින් ලබා ගෙන ඇති අතර එම ණය ආපසු පියවීමේ දී විදේශ සංචිත භාවිත කිරීමට සිදු වේ. තව ද, ශ්‍රී ලංකාවේ විදේශීය ජංගම ගිණුම 1978 වසරේ සිට අඛණ්ඩ ව හිඟයක් වාර්තා කර ඇති බැවින් එම හිඟය මූල්‍යනය කිරීම සඳහා ද විදේශ විනිමය වෙළෙඳපොළට මැදිහත් වීම සිදු කෙරෙයි. එ සේ ම ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජන රටෙන් පිටතට ගලා යෑම් සිදු වීමේ දී ද ඒ සඳහා මැදිහත් වීමට විදේශ සංචිත භාවිත කෙරෙයි. මෙවැනි තත්ත්වයක් හමුවේ

**2 වන රූප සටහන**

**2018 වසර අවසානයට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත**

සංයුතිය (එ.ජ. ඩොලර් මිලියන)




මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව


ප්‍රශස්ත මට්ටමකින් විදේශ සංචිත අඛණ්ඩ ව පවත්වා ගෙන යෑම අභියෝගාත්මක වේ.

## 8. විනිමය අනුපාතික කළමනාකරණය

1948 දී ශ්‍රී ලංකාව නිදහස ලබා ගන්නා අවධියේ දී බ්‍රෙටන්වුඩ්ස් ක්‍රමය යටතේ බ්‍රිතාන්‍ය පවුමට සම්බන්ධ කරන ලද ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමයක් පැවති අතර ඉන් අනතුරු ව විනිමය ක්‍රමය වෙනස්කම් රාශියකට භාජන විය. නිදහස ලබා ගැනීමෙන් පසුව ද ශ්‍රී ලංකාව, නිදහසට පෙර යටත් විජිත සමයේ දී රන් පවුම් කලාපය සමග ඇති කර ගත් වෙළෙඳ සම්බන්ධතා හේතුවෙන් රන් මිනුම යටතේ ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය අඛණ්ඩ ව පවත්වා ගෙන යන ලදී. 1949 අංක 4 දරන ව්‍යවහාර මුදල් (සංශෝධිත) පනත මගින් ශ්‍රී ලංකාවට ඕනෑ ම ව්‍යවහාර මුදලක් හා සම්බන්ධ විනිමය අනුපාතිකය සිය කැමැත්ත පරිදි තීරණය කිරීමේ අවකාශය ලබා දුණි. 1949 වසරේ දී රුපියල එක්සත් ජනපද ඩොලරයට එරෙහි ව සියයට 30කින් (එක්සත් ජනපද ඩොලර් 1 = රුපියල් 4.77) අවප්‍රමාණය කරන ලද අතර එමගින් මූලික වශයෙන් ම අපේක්ෂා කරන ලද්දේ ඩොලර් කලාපය වෙත කෙරෙන අපනයන ඉහළ නැංවීමයි. 1960 දශකය මැද භාගයේ දී අපනයන ආදායමට සාපේක්ෂ ව ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් 1967 වසරේ දී රුපියල එක්සත් ජනපද ඩොලරයට එරෙහි ව සියයට 20 කින් අවප්‍රමාණය විය. 1968 වසරේ දී විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර (වි.වි.හි.ස.) ක්‍රමය හඳුන්වා

**4 වන රූප සටහන**

**විදේශ විනිමය වෙළඳපළ වෙත මැදිහත්වීම**





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

දෙමින් ශ්‍රී ලංකාව ද්විත්ව විනිමය අනුපාතික ක්‍රමයක් වෙත යොමු විය. එහි දී අත්‍යවශ්‍ය ආනයන සහ සාම්ප්‍රදායික නො වන අපනයන සඳහා නිල විනිමය අනුපාතිකයක් ද අනෙකුත් ආනයන හා අපනයන සඳහා ඉහළ මට්ටමක අනුපාතිකයක් ද භාවිත කරන ලදී. 1972 වසරේ දී බ්‍රෙට්න්වුඩ්ස් ක්‍රමය බිඳ වැටීම ඇරඹීමත්, බ්‍රිතාන්‍ය පවුම පාවීමට ඉඩ හැරීමත් සමඟ ශ්‍රී ලංකා රුපියල බ්‍රිතාන්‍ය පවුමට පැවති සම මිල යටතේ නැවත සම්බන්ධ කරන ලදී. කෙසේ වුව ද විදේශීය රටවල ඇති වන සිදුවීම්වල බලපෑමෙන් රුපියල ආරක්ෂා කර ගැනීමේ අපේක්ෂාව ඇති ව 1976 වසරේ දී විනිමය අනුපාතිකය බර තැබූ ව්‍යවහාර මුදල් පැසකට සාපේක්ෂ ව නිර්ණය කිරීමට කටයුතු කරන ලදී. 1977 දී විනිමය අනුපාතිකය සෙමින් චලනය වෙමින් අනෙකුත් ව්‍යවහාර මුදල් සමඟ සම්බන්ධ ක්‍රමයක් (Crawling Peg) වෙත යොමු විය.

1977 වසරේ හඳුන්වා දුන් ලිහිල් ආර්ථික ප්‍රතිපත්ති සමඟ ද්විත්ව විනිමය අනුපාතික ක්‍රමය අහෝසි කරන ලද අතර රුපියල එක්සත් ජනපද ඩොලරයට එරෙහි ව සියයට 46 කින් අවප්‍රමාණය කර ඒකීය විනිමය අනුපාතිකයක් පවත්වා ගන්නා ලදී. ඒ සමඟ ම රුපියල පාවෙන්නට ඉඩ හැර ඉල්ලුම් සැපයුම් බලවේග මත විනිමය අනුපාතිකය තීරණය වීමට ඉඩ හරිමින් පාලිත පාවෙන විනිමය අනුපාතික ක්‍රමයක් වෙත යොමු විය. වාණිජ බැංකු විනිමය හුවමාරුවේ දී යොදා ගත යුතු අනුපාතික මහ බැංකුව විසින් නිවේදනය කළ අතර වාණිජ බැංකු විසින් ගනුදෙනුකරුවන් සඳහා වන ගැනුම් මිල හා විකුණුම් මිල එ සේ නිවේදනය කරන නිශ්චිත පරාසයක් තුළ පවත්වා ගෙන යන ලදී. මේ අතර 2001 වසරේ දී වාණිජ බැංකුවලට විනිමය අනුපාතික තීරණය කිරීමට ඉඩ සලසමින් මහ බැංකුව විසින් විදේශ විනිමය වෙළෙඳපොළ ලිහිල් කරණ ලදී. කෙසේ වුව ද, එහි දී විනිමය අනුපාතිකයන්ගේ අධික උච්චාවචන මැඩ පැවැත්වීම සඳහා අවශ්‍ය විට දී ශ්‍රී ලංකා මහ බැංකුව වෙළෙඳපොළ වෙත මැදිහත් විය.

**3 වන රූප සටහන**

**විනිමය අනුපාතිකය (එ.ජ. ඩොලරයට රුපියල්)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ගෝලීය මූල්‍ය අර්බුදය සමඟ 2008 සැප්තැම්බර් මාසයේ පමණ සිට ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළෙඳ පාර්ශ්වකරුවන්ගේ දේශීය මුදල්, එක්සත් ජනපද ඩොලරයට එරෙහි ව තියුණු ලෙස අවප්‍රමාණය වූ අතර එමගින් ශ්‍රී ලංකාවේ

අපනයනවල තරගකාරිත්වයට යම් බලපෑමක් ඇති විණි. එම නිසා, විනිමය අනුපාතිකය වඩාත් නම්‍යශීලී ලෙස තීරණය වීමට ඉඩ හැරීමට මහ බැංකුව විසින් කටයුතු කරන ලදී. මෑත කාලයේදී මහ බැංකුව වඩාත් වෙළෙඳපොළ පදනම් කර ගත් විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් අනුගමනය කළ අතර විනිමය අනුපාතිකය දේශීය මෙන් ම විදේශීය බලපෑම හමුවේ දැඩි ලෙස උච්චාවචනයට ලක් වූ අවස්ථාවල දී පමණක් යම් ප්‍රමාණයකට විදේශ විනිමය වෙළෙඳපොළට මැදිහත් විය.

## 9. සාරාංශය :-

ආර්ථිකයක විදේශ අංශයේ ස්ථායිතාව පවත්වා ගැනීමට ඉතා වැදගත් සාධකයක් වන විදේශ සංචිත සෑම රටක් ම පාහේ මනා අයුරින් කළමනාකරණය කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකාව ද විවිධ කාල පරිච්ඡේදවල දී විචක්ෂණශීලී ක්‍රියාමාර්ග අනුගමනය කරමින් විදේශ සංචිත කළමනාකරණය මෙන්ම විනිමය අනුපාතිකය ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීමට කටයුතු කර ඇත. කෙසේ වුව ද, විදේශ සංචිතවල ප්‍රමාණාත්මක වර්ධනය මෙන් ම ගුණාත්මක වර්ධනය ද පවත්වා ගෙන යෑම ඉතා වැදගත් වෙයි. එ නම් ණය නො වන මූලාශ්‍ර ආශ්‍රයෙන් විදේශ සංචිත වැඩි ප්‍රමාණයක් පවත්වා ගැනීම රටකට ඉතා යහපත් වේ.

ආශ්‍රිත ග්‍රන්ථ:


ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා, කොළඹ

නිදහස් ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය (1998), ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ

Samaratunga" D' and Perera" A' ^2012& —Demand for and Adequacy of International Reserves in Sri Lanka˜ Staff Studies" Volume 42" 1 & 2" Central Bank of Sri Lanka" Colombo

Monetary Law Act" No' 58 of 1949" Central Bank of Sri Lanka" Colombo

# බදු වියදම් පිළිබඳ ව අප විමසිලිමත් ලෙස විශ්ලේෂණය කළ යුත්තේ මන්ද?

කේ.ඒ.යූ.එස්.කේ. තිලකරත්න
ජ්‍යෙෂ්ඨ අර්ථශාස්ත්‍රඥ
ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

## බදු වියදම්

බදු වියදම් (Tax Expenditures) යනු තෝරා ගත් අංශ, ක්‍රියාකාරකම්, ප්‍රදේශ හෝ පුද්ගලයන් සඳහා බදු සම්බන්ධිත විශේෂිත සහන ලබා දීමේ ප්‍රතිඵලයක් ලෙස රජයේ ආදායම අඩු වීමයි. ඒ අනුව, බදු වියදම්වල ස්වරූප කිහිපයක් දැකිය හැකි ය. ඒවා නම්; දීමනා (බදු පදනමෙන් අඩු කිරීම), නිදහස් කිරීම් (බදු පදනමෙන් ඉවත් කිරීම), බදු සහන (අඩු බදු අනුපාතික), බදු බැර (බදු වගකීම අඩුකිරීම) සහ විලම්බිත බදු (බදු ගෙවීම කල් දැමීමට ඉඩ දීම) යනාදියයි[1]. එක්සත් රාජධානියේ ජාතික විගණන කාර්යාලයට අනුව, "බදු වියදම යනු සමාජීය හෝ ආර්ථික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් විශේෂිත කණ්ඩායමකට සහාය වීම සඳහා හෝ විශේෂිත කාර්යයක් ධෛර්යමත් කිරීම සඳහා බද්දට යටත් ආයතනයක බදු වගකීම අඩු කිරීමට හෝ කල් දැමීමට ඉඩ ලබා දීම සඳහා බදු නීතිවල පවත්නා විධිවිධානයකි. මෙසේ බදු වියදම් දැරීම වෙනුවට එම කාර්යය සඳහා රජයට සෘජු ව වියදම් දැරීම ද සිදු කළ හැකි ය. බදු ගෙවිය යුතු ආයතනයක විශේෂිත ලක්ෂණ පැවතීම හෝ විශේෂිත ක්‍රියාකාරකමක් සිදු කිරීමට හෝ නො කර සිටීමට තෝරා ගැනීම මත බදු වගකීම අඩු කර ගැනීම සඳහා හිමිකමක් පවතින විටෙක, බදු වියදමක් පැන නගියි"[2].

1 Tyson, J., Reforming Tax Expenditures in Italy: What, Why and How?, International Monetary Fund, WP/14/7, 2014

2 The Definition, Measurement and Evaluation of Tax Expenditures and Tax Reliefs, National Audit Office, The United Kingdom, 2014

## බදු වියදම් ගණනය කිරීමේ ක්‍රමවේද

බදු වියදම් ගණනය කිරීම සඳහා ප්‍රධාන ප්‍රවේශ තුනක් ඇත.[3]

1. **රජයට අහිමි වන ආදායම ගණනය කිරීමේ ප්‍රවේශය (Revenue Forgone Approach)**: යම් විශේෂිත බදු සහනයක් ලැබෙන බදු ගෙවන්නන් විසින් ගෙවනු ලබන බදු ප්‍රමාණය සහ එම සහනය නො ලබන බදු ගෙවන්නන් විසින් ගෙවනු ලබන බදු ප්‍රමාණය අතර වෙනස ගණනය කිරීම මෙම ප්‍රවේශය යටතේ සිදු වේ. මෙහි දී බදු ගෙවන්නන්ගේ හැසිරීම නො වෙනස් ව පවතී යයි උපකල්පනය කරමින් දැනට පවතින බදු ව්‍යුහය යටතේ රජයට ලැබෙන බදු ආදායම, වර්තමානයේ හෝ අනාගතයේ දී බදු වෙනස් කිරීමෙන් ලැබෙන බදු ආදායම සමඟ සැසඳීම සිදු කරයි.

2. **රජයට ලැබෙන ආදායම වැඩි කර ගත හැකි ප්‍රමාණය ගණනය කිරීමේ ප්‍රවේශය (Revenue Gain Approach)**: ලබා දී ඇති යම් බදු වියදමක් ඉවත් කළහොත් කොපමණ ප්‍රමාණයකින් රජයේ ආදායම ඉහළ යනවා ද යන්න මෙම ප්‍රවේශයේ දී ගණනය කරනු ලබයි. මෙම ඇස්තමේන්තුව නිවැරදි ව සිදු කිරීම සඳහා, ලබා දී ඇති බදු වියදම ඉවත් කළහොත් අදාළ පාර්ශ්වයන්ගේ හැසිරීමේ සිදු විය හැකි වෙනස්කම් තක්සේරු කිරීමට අවශ්‍ය වේ.

3 Tax Expenditures Statement 2012, Commonwealth of Australia, 2013

3. **වියදම් ප්‍රවේශය (Outlay Equivalence Approach):** බදු වියදමට සමාන ප්‍රතිලාභයක් ලබා දීම සඳහා රජයට කොපමණ ප්‍රමාණයක සෘජු වියදමක් දැරීමට අවශ්‍ය වේ ද යන්න මෙම ප්‍රවේශය මගින් ඇස්තමේන්තු කරනු ලබයි.

බදු වියදම් ඇස්තමේන්තු කිරීමේ දී ඉහත එක් එක් ක්‍රමවේදය මගින් සැලකිය යුතු වෙනස් තක්සේරුවක් ලැබීමට ඉඩ ඇත. තව ද, බදු පිරිවැය ගණනය කිරීම සඳහා පිළිගත් නිශ්චිත ක්‍රමවේදයක් නොමැති හෙයින් ලෝකයේ විවිධ රටවල් විවිධ ක්‍රමවේද භාවිත කරනු ලබයි. කෙසේ වෙතත්, රජයට අහිමි වන ආදායම ගණනය කිරීමේ ප්‍රවේශය බහුල ව ම භාවිත වන අතර එය බදු වියදම් ගණනය කිරීම සඳහා වඩාත් විශ්වසනීය ම ක්‍රමයයි.

## බදු වියදම්වල පිරිවැය සහ ප්‍රතිලාභ

බදු වියදම් ප්‍රධාන වශයෙන් යොමු වන්නේ, ආයෝජන ආකර්ෂණය කර ගැනීමට, රැකියා අවස්ථා ජනනය කිරීමට සහ ආර්ථික වර්ධනයට හේතු වන විශේෂිත ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා බදු ගෙවන්නන් දිරි ගැන්වීමට ය. සාමාන්‍යයෙන්, කෘෂිකර්මාන්තය සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් මත පහළ බදු අනුපාතික පනවනු ලැබේ. ඊට අමතර ව, මානව සංවර්ධනය හෝ සමාජ සුභසාධනය වැඩිදියුණු කිරීම සඳහා ද බදු වියදම් ලබා දිය හැකි ය. ඒ අනුව, අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා බදු නිදහස් කිරීම් හෝ පහළ බදු අනුපාතික පැනවීම සිදු කළ හැකි ය.

කෙසේ වෙතත්, බදු වියදම් ලබා දීම රජයට දැරීමට සිදු වන පිරිවැයකි. ඒ අනුව, බදු වියදම් ලබා දීම මගින් රජය බලාපොරොත්තු වූ අරමුණු සාර්ථක ව අත්පත් කර ගත්තේ ද යන්න අධීක්ෂණය කිරීම සඳහා කාර්යසාධන ඇගයීමේ ක්‍රියාමාර්ග ස්ථාපිත කිරීම ඉතා වැදගත් වේ. බදු වියදම් ලබා දීම මගින් රජය අපේක්ෂා කළ අරමුණු ළඟා කර ගත්තේ වුව ද, එම අරමුණු ඉක්මවා ගිය එහි ප්‍රතිඵල පිළිබඳ ව පුළුල් ලෙස ප්‍රශ්න නැගිය හැකි ය. මක් නිසා ද යත්, බදු වියදම් මගින් රජයේ බදු අය කර ගැනීමේ හැකියාව අඩු කෙරෙන අතර එය රාජ්‍ය මූල්‍ය අවකාශය අඩු වීමට ද හේතු වෙයි. ඊට අමතර ව, විවිධ පාර්ශ්ව විසින් සමහර බදු වියදම් අවභාවිත කරනු ලබයි. නිදසුනක් වශයෙන්, විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා ලබා දෙන බදු සහන අවභාවිත කිරීමෙන් බහුජාතික සමාගම් විසින් ලාභ හා ලාභාංශ සිය රටවලට රැගෙන යන අතර ඒ තුළින් සංවර්ධනය වෙමින් පවතින රටවල් අවදානමකට ලක් වේ.[4] ඒ අනුව, එවැනි බදු වියදම් ලබා දීමෙන් සමාජය වඩාත් යහපත් වේ ද, නැතිනම් අයහපතට පත් වේ ද යන්න හඳුනා ගැනීම සඳහා බදු වියදම්වල පිරිවැය හා ප්‍රතිලාභ සංසන්දනය කිරීම අත්‍යවශ්‍ය වේ.

## ශ්‍රී ලංකාවේ බදු වියදම් අඩු කර ගැනීම සඳහා අනුගමනය කරනු ලැබූ මෑත කාලීන ප්‍රධාන ප්‍රතිපත්තිමය පියවර

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායම ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකි ය. එනම්, බදු ආදායම (සියයට 90ක් පමණ) සහ බදු නො වන ආදායම (සියයට 10ක් පමණ) වශයෙනි. ඒක පුද්ගල ආදායම ඒකාකාරී ව වර්ධනය වී තිබියදීත් 1990 ගණන් සිට රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදනයෙහි ප්‍රතිශතයක් ලෙස ක්‍රමානුකූල ව අඩු වී ඇත. දළ දේශීය නිෂ්පාදනයෙහි ප්‍රතිශතයක් ලෙස බදු ආදායම 1990 දී සියයට 19.0 ක් වූ අතර 2014 දී එය සියයට 10.1 දක්වා අඩු විය. කෙසේ වුව ද, එය 2015 දී සියයට 12.4 දක්වා ඉහළ ගිය අතර 2016 දී සියයට 12.3ක් සහ 2017 දී සියයට 12.6ක් විය. ශ්‍රී ලංකාවේ බදු ආදායම පහළ මට්ටමක පැවතීම සඳහා බලපා ඇති ප්‍රධාන හේතුවක් වනුයේ වරින් වර බදු වියදම් ලබා දීමයි. තව ද, බදු වියදම්හි ශුද්ධ ප්‍රතිලාභ පිළිබඳ ව නිසි අධ්‍යයනයක් සිදු කර නොමැති අතර බදු වියදම් විශ්ලේෂණයක් සිදු කිරීම මැදිකාලීන ව රටේ අයවැය සකස් කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට ද දායක වනු ඇත.

බදු ආදායම දළ දේශීය නිෂ්පාදනයෙහි ප්‍රතිශතයක් ලෙස අඩු වීමේ ප්‍රවණතාව මඟහරවා ගැනීම සඳහා විවිධ රජයන් විසින් විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී. ඒ අනුව, බදු ආදායම ඉහළ නංවා ගැනීමට සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පුළුල් අධ්‍යයනයක් සිදු කිරීමට 2009 වසරේ දී බදුකරණය පිළිබඳ ජනාධිපති කොමිසමක් පත් කරන ලදි. පසුකාලීන ව සිදු කරනු ලැබූ

4 ශ්‍රී ලංකාවේ බදු ආදායම ඉහළ නැංවීම: අභියෝග සහ ප්‍රතිපත්ති, 2014 වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව

5 අයවැය වාර්තාව 2011, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

ප්‍රතිපත්තිමය වෙනස්කම්වල දී මෙම සමහර නිර්දේශ ක්‍රියාත්මක කරන ලදි.[5] ඒ අනුව, බදු වියදම් අඩු කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ අතර බදු පදනම පුළුල් කිරීම සඳහා 2011 වසරේ දී රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයින් සඳහා උපයන විට ගෙවීමේ බද්ද (Pay-As-You-Earn (PAYE)) හඳුන්වා දීම ද 2013 වසරේ දී තොග හා සිල්ලර වෙළඳාම මත එකතු කළ අගය මත බදු (Value Added Tax (VAT)) පැනවීම ද සිදු කරන ලදී. රජය වර්තමානයේ දී ආදායම් පාදක කර ගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියක් අනුගමනය කරනු ලබන අතර තවදුරටත් බදු වියදම් අඩු කර ගැනීමේ උත්සාහයක නිරත වෙමින් සිටියි. ඒ අනුව, 2016 නොවැම්බර් මාසයේ දී ජාතිය ගොඩනැගීමේ බද්ද (Nation Building Tax (NBT)) හා එකතු කළ අගය මත බද්ද යටතේ වූ බදු නිදහස් කිරීම් ගණනාවක් ඉවත් කරන ලදී. එ සේ ම, 2017 අගෝස්තු මාසයේ දී ද, ජාතිය ගොඩනැගීමේ බද්ද යටතේ වූ තවත් බදු නිදහස් කිරීම් ගණනාවක් ඉවත් කරන ලදී. මීට අමතර ව, 2018 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන නව දේශීය ආදායම් පනත[6] මගින් ආදායම් බදු යටතේ ලබා දෙනු ලබන බදු නිදහස් කිරීම් අවම කිරීමට ද කටයුතු කර ඇත.

## බදු වියදම් ප්‍රකාශය

සංවර්ධිත රටවල් ඇතුළු රටවල් ගණනාවක් විසින් බදු වියදම් ප්‍රකාශ ප්‍රසිද්ධියට පත් කරනු ලබයි. 2016 නොවැම්බර් මාසයේ දී 2017 වසර සඳහා අයවැය ඉදිරිපත් කිරීමේ දී, රාජ්‍ය මූල්‍ය කටයුතුවල විනිවිදභාවය වැඩිදියුණු කර ගැනීමේ අපේක්ෂාවෙන්, ප්‍රථම වරට ශ්‍රී ලංකාව තුළ බදු වියදම් ප්‍රකාශයක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදි.[7] මෙවැනි ලියවිල්ලක් අයවැය ලේඛනය තුළ අත්‍යවශ්‍ය අංගයක් බවට පත් වීම ජාත්‍යන්තර ව පිළිගත් ක්‍රමවේදයක් වන අතර ඒ මගින් ජාත්‍යන්තර ව අරමුදල් සපයන ආයතන වෙත යහපත් රාජ්‍ය මූල්‍ය කළමනාකරණයක් පිළිබඳ ව සහතිකයක් ලබා දෙයි. තව ද, අඛණ්ඩ ව දෙවන වතාවට 2018 වසර සඳහා වූ අයවැය තුළ ද බදු වියදම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇත[8]. ඒ අනුව, 2018 වසර සඳහා ආදායම් බදු මත බදු වියදම රුපියල් බිලියන 3.4 (දළ දේශීය නිෂ්පාදනයෙහි ප්‍රතිශතයක් ලෙස 0.02%)ක් සහ එකතු කළ අගය මත බදු වියදම රුපියල් බිලියන 160.5 (දළ දේශීය නිෂ්පාදනයෙහි ප්‍රතිශතයක් ලෙස 1.1%)ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 2018 වසරේ දී එකතු කළ අගය මත බද්දෙන් අපේක්ෂිත ආදායම රුපියල් බිලියන 550.0ක් වන අතර, බදු වියදම් මුළුමනින්ම කපා හරින්නේ නම් එකතු කළ අගය මත බදු ආදායම 29%කින් පමණ වැඩි කර ගත හැකි බව මින් පෙන්නුම් කෙරේ. රජයේ ආදායම වැඩි කර ගැනීම සඳහා බදු වියදම් අධ්‍යයනය කිරීමේ වැදගත්කම මේ අනුව පැහැදිලි වේ.

## ඉදිරි දැක්ම

බදු ප්‍රතිපත්තියෙහි සිදු කරනු ලබන වෙනස්කම් හා බදු පරිපාලනය වැඩිදියුණු කිරීම මගින් රාජ්‍ය ආදයම දළ දේශීය නිෂ්පාදනයෙහි ප්‍රතිශතයක් ලෙස 2020 වසර වන විට සියයට 16ක් පමණ දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.[9] එබැවින්, විවිධ අරමුණු වෙනුවෙන් රජය විසින් ලබා දී ඇති බදු සහන සහ බදු නිදහස් කිරීම් සඳහා අදාළ පිරිවැය ගණනය කිරීම මගින් බදු වියදම්වල බලපෑම හඳුනා ගැනීම සඳහා මෙය වඩාත් ම සුදුසු කාලය වන අතර, අත්‍යවශ්‍ය අංශවලට පමණක් බදු වියදම් සීමා කරමින් බදු වියදම් තාර්කීකරණය කිරීම සඳහා පියවර ගත යුතු ය.■

6 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත.

7 අයවැය වාර්තාව 2017, මුදල් අමාත්‍යාංශය

8 අයවැය වාර්තාව 2018, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

9 වාර්ෂික වාර්තාව 2017, ශ්‍රී ලංකා මහ බැංකුව

## ඔබට
# මිලියනයක දිනුමක්!
**දිනුම ලබා ගැනීමට**
**සුළු අමතර ගාස්තුවක් ගෙවන්න**

## ඔයාට මගේ ආදරය දැනෙනවා නම්...
**මේ, මට ඔයාගේ උදව් ඕනම වෙලාවයි**

## ඔබේ නමට පාර්සලයක් ඇත!
**රේගුවෙන් නිදහස් කිරීමට සහනදායී ගාස්තුවක් ගෙවන්න**

## ඔබ වටිනා වාහනයක් දිනා ඇත!
**නිවසටම ගෙන්වා දීමට අදාළ රේගු ගාස්තු ගෙවන්න**

# අනගි රැකියාවක් !
## සුළු ලියාපදිංචි ගාස්තුවක් පමණයි

# සැලකිලිමත් වන්න
**වංචාකරුවන්ගේ මෙ වැනි ක්‍රමෝපායන්ට නො රැවටෙන්න**

ඔබගේ වයස් සීමාව, ස්ත්‍රී/පුරුෂ භාවය, අධ්‍යාපන පසුබිම හෝ ආදායම් මට්ටම කුමක් වුවත් පහසුවෙන් ම ඔබත් මෙම වංචාකරුවන්ගේ ගොදුරක් විය හැක.

වංචාවන්ට ගොදුරු වූ විට ඔබට සිදු වන මූල්‍යමය අලාභය සහ ඇති වන මානසික පීඩාව සුළුපටු නො වේ.

ඔබ රැවටීම සඳහා ලිපි, තැපැල් පත්, සමාජ ජාල අඩවි, දුරකථන ඇමතුම්, කෙටි පණිවුඩ, විද්‍යුත් තැපෑල, අන්තර්ජාල පණිවුඩ හුවමාරු සේවා මගින් වංචාකරුවන් ඔබ හා සම්බන්ධ විය හැක.

වංචාකරුවන්ගේ අරමුණ ඔබ රවටා ඔබගේ විශ්වාසය දිනා ගැනීමයි.
ඔවුනට නො රැවටීම ඔබේ වගකීමයි.

මූල්‍ය බුද්ධි ඒකකය
ශ්‍රී ලංකා මහ බැංකුව
නො. 30, ජනාධිපති මාවත, කොළඹ 01.

112477125
112477692
info@fiusrilanka.gov.lk

රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව,
ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.